වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

වාර්ෂික වාර්තාව **2022**

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

නො.160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත,කොළඹ 07

දුරකථන: (+94) 112 697758

(+94) 112 681052

(+94) 112 696261

වෙබ් අඩවිය: https://pgim.cmb.ac.lk

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

මහාචාර්ය සේනක රාජපක්ෂ
අධ්‍යක්ෂක
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි
ආයතනය

මහාචාර්ය චාන්දනී වනිගතුංග
නියෝජ්‍ය අධ්‍යක්ෂක
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

එස්.අනූෂා
නියෝජ්‍ය ලේඛකාධිකාරී
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි
ආයතනය

දැක්ම

රටෙහි සහ කලාපයෙහි සෞඛ්‍ය අවශ්‍යතා සැපිරීම සහ ලෝක සෞඛ්‍යය ප්‍රවර්ධනයට සහාය වීම උදෙසා ඉහළම කාර්‍යක්ෂමතාවකින් යුත් විශේෂඥවරුන් සහ අනෙකුත් වෘත්තිකයන් බිහිකිරීම පිළිබඳව වන ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම.

මෙහෙවර

ශ්‍රී ලාංකීය ජනතාවට, කළාපයට සහ ලෝකයට ප්‍රශස්ත සහ මානුෂික සෞඛ්‍ය සත්කාරයන් සැලසීම වෙනුවෙන් ඉහළම ගුණාත්මකභාවය, ප්‍රවීණත්වය සහ කැපවීම සහිත විශේෂඥවරුන් සහ අනෙකුත් වෘත්තිකයන් බිහිකිරීම සඳහා අවශ්‍ය පශ්චාත් අධ්‍යයන වැඩසටහන් සැලසුම් කිරීම සහ සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය.

අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය



2022 වර්ෂය සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව අතිශයින්ම සතුටුවෙමි.

ශ්‍රී ලංකාව තුළ වෛද්‍ය වෘත්තිකයන් සහ දන්ත වෛද්‍ය වෘත්තිකයන් හට විශේෂඥ පුහුණු සැපයීම සඳහා පවතින එකම ආයතනය වන්නේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයයි. එතුළ වර්තමානය වනවිට ක්‍රියාත්මක වන අධ්‍යයන මණ්ඩල 23ක්, විශේෂ මණ්ඩල 33ක් සහ අතුරු විශේෂඥ මණ්ඩල 04 ක් යටතේ එම්.ඩී සහ එම් එම්.එස්.සී උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා පශ්චාත් උපාධි සහතික පත්‍ර සහ විශේෂඥ වෛද්‍යවරුන් සඳහා මණ්ඩල සහතිකධාරීත්වය පිරිනැමීම දක්වා දිවෙන අධ්‍යයන වැඩසටහන් 141 ක් අප විසින් පවත්වන ලදී. මේ වනවිට නව බඳවාගැනීම් 894 කින් සමන්විත වූ සහ සමස්තයක් ලෙස 4271 ක් වූ පශ්චාත් උපාධි පුහුණුලාභීන් සංඛ්‍යාවක් ඉහත පුහුණු වැඩසටහන් සඳහා ලියාපදිංචිව සිටිති. 2022 වර්ෂයේදී අප විසින් විභාග 121 ක් පැවැත්වූ අතර එම්.ඩී උපාධි 482 ක් සහ එම් එම්.එස්.සී උපාධි 116 ක්ද, පශ්චාත් උපාධි ඩිප්ලෝමාවන් 251 ක්, පශ්චාත් උපාධි සහතික 60 ක් සහ විශේෂඥ වෛද්‍යවරුන් සඳහා මණ්ඩල සහතිකධාරීත්වයන් 199 ක් පිරිනැමීමද සිදු කරන ලදී.

ළමා චිකිත්සක හෘත් උරස්ථ ශල්‍යවේදය සඳහා මණ්ඩල සහතිකකරණය යන නව පුහුණු වැඩසටහන සඳහා උපාධි ප්‍රකාශපත්‍ර සැකසීම අවසන් කරනු ලැබිණි. පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහනක් සහ එම් එම්.එස්.සී වැඩසටහනක් ශාස්ත්‍රපති මට්ටම දක්වා ඉහළ දැමිණි.

2022 වසරේදී පවතින වැඩසටහන්හි විෂය මාලා සහ උපාධි ප්‍රකාශපත්‍ර 07 ක් ප්‍රතිශෝධනය කරන ලද අතර තවත් 07 ක් ප්‍රතිශෝධනය වෙමින් පවතී.

රොඩ්නි වීදියේ ඉදිකෙරුණු අධ්‍යයන ගොඩනැගිල්ලෙහි ක්‍රියාකාරීත්වය තවදුරටත් ඉහළ නංවන ලද අතර එහි විද්‍යාගාර සඳහා අවශ්‍ය මෙවලම් සපයා දී ඒවාද ක්‍රියාකාරී තත්ත්වයට පත් කරනු ලැබිණි. මේ වනවිට අධ්‍යයන මධ්‍යස්ථානයෙහි අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්, විභාග සහ ඉගැන්වීම් සැසි දිනපතාම පාහේ පැවැත්වේ, පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය වෙත නව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු බඳවා ගනු ලැබිනි

කොවිඩ් 19 හේතුවෙන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට නවතම ආකාරයේ අභියෝගයන් රැසකට මුහුණ දීමට සිදුවිය. කොවිඩ් වසංගතය හේතුවෙන් සිදුවූ රට වසා දැමීම් ඇතුළු අනෙකුත් සීමා කිරීම් හමුවේ පවා, බොහෝ ක්‍රියාකාරකම් මාර්ගගත අයුරින් සිදුකිරීමට යොමුවීම ඔස්සේ සහ කඩදාසි භාවිතයෙන් තොර කාර්යාලයක් පවත්වාගැනීම වෙත යොමුවීම මගින් පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය විසින් ඉතා ඉහළ මට්ටමේ ක්‍රියාකාරීත්වයක් පවත්වාගෙන යාමට සමත් විනි. ඒ සමගම වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, තම කාර්ය මණ්ඩල, පුහුණු කරුවන්, සහ පුහුණු ලාභීන් යන පාර්ශ්වයන්ගේ සුරක්ෂිත බව

තහවුරු කරනු පිණිස ජාතික මාර්ගෝපදේශයන් අනුව යමින් සෞඛ්‍යාරක්ෂිත උපායමාර්ගයන් ද අනුගමනය කරන ලදී.

මෙම කටයුතු සාර්ථකව ඉටුකිරීමෙහි ලා පශ්චාත් අපාධි වෛද්‍ය විද්‍යා ආයතනයට දැක්වූ දායකත්වය පිළිබඳව එහි කළමනාකරණ මණ්ඩල සාමාජිකයන්, අධ්‍යයන මණ්ඩල, විශේෂඥ අධ්‍යයන මණ්ඩල සහ විභාග මණ්ඩල සාමාජිකයන්, පුහුණුකරුවන් සහ විභාග පරීක්ෂකයන් හට මාගේ ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි. එමෙන්ම තම රාජකාරි ප්‍රශංසනීය අන්දමින් ඉටුකර ඇති අපගේ පරිපාලන සහ ලිපිකාර කාර්ය මණ්ඩලයටද මාගේ ස්තුතිය හිමිවේ.

මහාචාර්ය සේනක රාජපක්ෂ
අධ්‍යක්ෂ/වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අන්තර්ගතය

1. කළමනාකරණ මණ්ඩලය 10

2. සම්පත් හා සිසුන් පිළිබඳව විස්තර 11

3. දේශීය සිසුන් පිළිබඳව විස්තර 11

4. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර 12

5. අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර 12

6. පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර 13

7. නව පාඨමාලා පිළිබඳ විස්තර 13

8. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර 13

9. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර 13

10. මූල්‍ය ප්‍රගතිය (වියදම්) පිළිබඳ විස්තර 14

11. මූල්‍ය ප්‍රගතිය (උත්පාදනය කරන ලද ආදායම්) පිළිබඳ විස්තර 14

12. මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2022 14

13. 2022 වර්ෂයේදී ලැබූ යටිතල පහසුකම් පිළිබඳ විස්තර 15

14. වෙනත් තොරතුරු 16

    14.1. අධ්‍යාපනික ක්‍රියාකාරකම් 16

    14.2. ඇගයුම් සහ විභාග කටයුතු 36

    14.3. පුස්තකාලය 57

    14.4. සාමාන්‍ය පරිපාලනය 79

    14.5. මූල්‍ය 89

15. තිරසර සංවර්ධනය පිලිබඳව වාර්තාව 133

16. 2022 වසරේ සිදුවූ විශේෂ සිදුවීම් 137

17. විගණන වාර්තාව සහ පිලිතුරු 138

ඓතිහාසික පසුබිම

1870 වර්ෂයේ දී ලංකා වෛද්‍ය විද්‍යාලය ස්ථාපනය කිරීමත් සමඟ ශ්‍රී ලංකාව තුළ වෛද්‍ය අධ්‍යාපනය ආරම්භ වූ අතර 1942 දී ලංකා විශ්වවිද්‍යාලය පිහිටුවීමෙන් අනතුරුව එහි වෛද්‍ය පීඨය බවට පත්වන්නේ මෙම ලංකා වෛද්‍ය විද්‍යාලයයි . එම්.ඩී සහ එම්.ඕ.පී උපාධි පිරිනැමීම සඳහා විභාග පැවැත්වීම ආරම්භවූ 1952 වර්ෂයද එම්.එස් උපාධිය පිරිනැමීම සඳහා විභාග පැවැත්වීම ආරම්භවූ 1953 වර්ෂයද වනතුරුම ලංකා විශ්වවිද්‍යාලය මගින් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ප්‍රදානය සඳහා විභාග පවත්වනු නොලැබිණ.

එවකට ලංකාව තුළ ව්‍යූහාත්මක හෝ සංවිධිතාත්මක පශ්චාත් උපාධි පුහුණුකිරීම් සිදු නොකෙරුණු අතර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි පුහුණුව ලබාගත හැකිවූයේ එක්සත් රාජධානියේ පැවැති වෛද්‍ය විද්‍යායතන මගිනි. ඒවායින් පිරිනමනු ලැබූ MRCP, FRCS, FFARCS, MRCOG, FRCR, MRCPath, MRCPsych සහ FDSRCS වැනි සුදුසුකම් විශේෂඥ වෛද්‍යවරුන් පත්කිරීමේදී සෞඛ්‍ය අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල මගින් පිළිගන්නා ලද සුදුසුකම් විය. මෙම විදේශ පුහුණුව වෙනුවට අධීක්ෂණය කරනු ලැබීමට යටත්ව තෙවසරක සේවාස්ථ පුහුණුවක් ලබා දීමෙන් අනතුරුව විභාගයක් පැවත්වියයුතු බව 1973 වසරේදී වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි අධ්‍යාපනය පිළිබඳ උපදේශක කමිටුවක් මගින් රජයට නිර්දේශ ඉදිරිපත්කරනු ලැබීය. ඒ අනුව, 1972 අංක 1 දරන ලංකා විශ්ව විද්‍යාල පනතේ විධිවිධාන යටතේ 1976 වසරේ දී පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය (ෂඡඨඑ) ස්ථාපනය කර කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ කරනු ලැබීය. ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්, වෛද්‍ය හැල්ෆ්ඩෑන් මාහ්ලර් විසින් 1976 මාර්තු 2 වන දින පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය (PGIM) නිල වශයෙන් ආරම්භකරනු ලැබූ අතර මහාචාර්ය කේ.එන්. සෙනෙවිරත්න මහතා එහි ප්‍රථම අධ්‍යක්ෂවරයා වශයෙන් පත්විය.

කෙසේ වුවද, එක්සත් රාජධානියේ විද්‍යායතන මගින් පවත්වනු ලැබූ විභාග කොළඹ දී පැවැත්වීම අඛණ්ඩව සිදුවීමත්, වෛද්‍ය වෘත්තිකයන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විභාගවලට පෙනීසිටීමට වඩා එක්සත් රාජධානියේ විභාගවලට පෙනී සිටීමට ප්‍රියමනාපභාවයක් දැක්වීම හේතුකොටගෙන අභිනවයෙන් පිහිටුවනු ලැබූ ආයතනයේ කටයුතු අඩාල විය. එබැවින්, මෙම ආයතනයේ ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම අවශ්‍ය විය. එක්සත් රාජධානියේ විද්‍යායතන මගින් ශ්‍රී ලංකාව තුළ විදේශීය පශ්චාත් උපාධි විභාග පැවැත්වීම 1980 ජනවාරි 1 වනදා සිට ක්‍රියාත්මකවන පරිදි නවතාලීමටත්, මෙම ආයතනය මගින් ලබාදෙන පශ්චාත් උපාධි සඳහා පූර්ණ පිළිගැනීමක් ලබා දීමට සහ වැඩි සැලකිල්ලක් දැක්වීමටත් රජය තීරණය කරන ලදී.

ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීමේ අරමුණින් මෙම ආයතනය 1978 අංක 16 දරනවිශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ 1979 වසරේ දී නැවත ස්ථාපනය කර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය(PGIM) ලෙස නැවත නම්කරනු ලැබීය. වෛද්‍ය එස්.ඒ. කබ්රාල් මහතා එහි ප්‍රථම අධ්‍යක්ෂවරයා ලෙස පත්කරනු ලැබීය. ඒ අනුව, ඉහත සඳහන් කරන ලද විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ සම්පාදනය කරන ලද 1980 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන ආඥාපනත අංක 1 1980 අප්‍රේල් මස 10 වනදා සිට බලාත්මක විය. වෛද්‍ය විද්‍යාවේ විවිධ විශේෂඥතාවන් සඳහා අධ්‍යයන මණ්ඩල ප්‍රතිසංවිධානය කරනු ලැබූ අතර නිර්වින්දනවේදය, ප්‍රජා වෛද්‍යවිද්‍යාව, දන්ත ශල්‍යවේදය, පවුල් වෛද්‍ය විද්‍යාව සහ සාමාන්‍ය වෛද්‍ය කර්මය, වෛද්‍යවිද්‍යාව, නාරිවේදය හා ප්‍රසවවේදය, අක්ෂිවේදය, ව්‍යාධිවේදය, ළමාවිකිත්සාව, මනෝවිකිත්සාව, විකිරණවේදය සහ ශල්‍යවේදය වැනි විවිධ විශේෂඥතාවන් සඳහා පාඨමාලා හා විභාග සංවිධානය කරන ලදී. 1985 වසරේ දී තවත් අධ්‍යයන මණ්ඩල හතරක් එනම්, වෝහාරික වෛද්‍ය විද්‍යාව, වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව, කර්ණ නාසික ස්වරාලවේදය සහ සායනික අර්බුදවේදය ස්ථාපනයකරනු ලැබීය. මහාචාර්ය ආර්.ජී. පානබොක්කේ මහතා 1990 වසරේ දී මෙම ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස පත්විය. වෛද්‍ය පරිපාලනය සහ චර්මවේදය පිළිබඳ අධ්‍යයන මණ්ඩල

1994 දී ද, මෛථුනවේදය පිළිබඳ අධ්‍යයන මණ්ඩල 2001 වසරේ ද ස්ථාපනය කරන ලදී. වෛද්‍ය ජේ.බී.පීරිස් මහතා 1995 වසරේ ද, මහාචාර්ය ලලිතා මෙන්ඩිස් මහත්මිය 2002 වසරේ ද, මහාචාර්ය රෙස්වි ෂෙරීෆ් මහතා 2006 වසරේ ද, මහාචාර්ය ජයන්ත ජයවර්ධන 2012 වසරේ ද, මහාචාර්ය එච්.ජානක ද සිල්වා මහතා 2014 වසරේ ද, මහාචාර්ය සේනක රාජපක්ෂ මහතා 2020 වසරේ මෙම ආයතනයේ අධ්‍යක්ෂවරුන් ලෙස පත්වූහ.නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර 2011 වසරේ දී ස්ථාපනය කරන ලද අතර මහාචාර්ය ජයන්ත ජයවර්ධන, මහාචාර්ය ප්‍රශාන්ත විජේසිංහ, මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන, මහාචාර්ය සේනක රාජපක්ෂ සහ මහාචාර්ය චාන්දනී වනිගතුංග මෙම ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර දැරූහ. 1980 ආඥාපනත සඳහා සිදුකරන ලද සංශෝධන 2014 ජූලි 1 වන දින සිට බලාත්මකවූ අතර සංශෝධිත ආඥාපනත යටතේ නව අධ්‍යයන මණ්ඩල කීපයක් සහ විවිධ විශේෂඥතාවන් සඳහා අධ්‍යයන මණ්ඩල කීපයක් ස්ථාපනය කරන ලදී.

අරමුණු

- පශ්චාත් උපාධි පුහුණු සැපයීමේදී තොරතුරු, සන්නිවේදන තාක්ෂණය සහ සාමාන්‍යාකෘති කරණය යනාදිය භාවිතා කිරීම පුළුල් කිරීම.

- ජාතික සෞඛ්‍ය සේවා අවශ්‍යතාවන් සැපිරිය හැකි පරිදි අධ්‍යයන වැඩසටහන් වැඩිදියුණු කිරීම.

- රටෙහි වෛද්‍ය අධ්‍යාපනය සහ ඒ සම්බන්ධ ප්‍රතිපත්තීන් විධිමත්ව සකස් කිරීම සහඒවා ක්‍රියාත්මක කිරීම සඳහා සක්‍රීයව දායක වීම.

- විශිෂ්ඨ අධ්‍යයන ආයතනයක් බවට පත්වීමේ අරමුණ ඇතිව කලාපීය මෙන්ම විශ්වීය පිළිගැනීමක් ලැබෙන පරිදි අධ්‍යයන වැඩසටහන් ජාත්‍යන්තර මට්ටමට ගෙනඒම.

- ශ්‍රී ලංකාවේ දන්ත වෛද්‍යවරුන්, අනෙකුත් වෛද්‍යවරුන් අතර අඛණ්ඩ වෘත්තීයමය සංවර්ධනයක් ගොඩනැංවීමේ අරමුණින් විධිමත් වැඩසටහනක් ඇරඹීම සඳහා නායකත්වය සැපයීම.

පරමාර්ථ

- දේශීය අවශ්‍යතාව සැපිරිය හැකි පරිදි ඉහළ මට්ටමේ ගුණාත්මක භාවයකින් සමන්විත සෞඛ්‍ය සේවාවක් සඳහා ප්‍රමාණවත් මිනිස් සම්පතක් බිහි කිරීම.

- නිරන්තර ඉගෙනුම තුලින් සෞඛ්‍ය වෘත්තීකයින්ගේ කුසලතා සහ නිපුණතාවන් පවත්වාගෙන යාම සහ වැඩිදියුණු කිරීම.

- සෞඛ්‍ය වෘත්තිකයින් හට නිරන්තර අධ්‍යයනයන් සඳහා ඉඩ පහසුකම් සලසන ක්‍රමවේදයන් සොයාගැනීම සහ නිර්මාණය කිරීම.

- වෛද්‍ය වෘත්තීකයින් තුළ සඵලදායක ආකල්ප සහ ස්වයං ඉගෙනුම් ප්‍රවර්ධනය කිරීම.

- පශ්චාත් උපාධි අධ්‍යයනයන්ට අදාළව පවතින සම්පත් සහ සුදුසු තාක්ෂණයන් භාවිතා කිරීම දිරිගැන්වීම.


- සෞඛ්‍ය ගැටළු විසඳීමේදී සෞඛ්‍ය සේවා කණ්ඩායම් ප්‍රවේශය භාවිතා කිරීම පිළිබඳ සංකල්පය හඳුන්වාදීම.

- දුර්වලතා සහ වැඩිදියුණු කරගතයුතු අංශ පිළිබඳව තොරතුරු රැස්කරගැනීම සඳහා වෛද්‍ය අධ්‍යාපනික වැඩසටහන් ඇගයීමට ලක් කිරීම.

- නිවාරක සහ ප්‍රතිකාරක සත්කාරයන් මෙන්ම හෙද සත්කාරයන්ද මනා ලෙස අනුකලනය වූ සේවාස්ථ වැඩසටහන් සංවිධානය කිරීම.

- ශ්‍රී ලංකාව තුළ පශ්චාත් උපාධි මට්ටමේ වෛද්‍ය අධ්‍යාපනය ඉහළ මට්ටමකින් පවත්වාගැනීම සඳහා විදේශීය අධ්‍යාපනික ආයතන සමග අනෙන්‍යොන්‍ය ශුභසිද්ධිය සැලසෙන ආකාරයෙන් අධ්‍යාපනික සබඳතාවන් වැඩිදියුණු කරගැනීම. රටෙහි සෞඛ්‍ය සේවා අවශ්‍යතාවන් සැපිරීම මෙන්ම කලාපය සහ ලොව පුරා වෛද්‍ය විද්‍යාවේ විවිධ ක්ෂේත්‍රයනට ක්‍රියාකාරී දායකත්වයක් සපයන්නාවූ විශේෂඥ වෘත්තීකයන් බිහිකරන්නාවූද මූල්‍යමය සහ පරිපාලනමය වශයෙන් ස්වාධීනව ක්‍රියාත්මකවන ජාත්‍යන්තරව පිළිගැනීමක් සහිත විශිෂ්ට ආයතනයක් බවට පත්වීම.

ආයතනික සැකැස්ම


කළමනාකරණ මණ්ඩලය
අධ්‍යක්ෂක
විගණන අධ්‍යක්ෂ
ආවාර ධර්ම සම්පාදන කමිටුව
සම්පාදක මණ්ඩලය
විගණන කමිටුව
මූල්‍ය කමිටුව
අධ්‍යයන මණ්ඩලය
විභාග මණ්ඩලය
විශේෂ අධ්‍යයන මණ්ඩලය
අධ්‍යයන කටයුතු ප්‍රතිපාදන හා විභාග කමිටුව
රෙජිස්ට්‍රාර් කාර්යාලය
රෙදෙපැ අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය (MERC)
රෙදෙපැ විදුහ පශ්චාත් උපාධි අධ්‍යාපන ප්‍රවාහයේ කාර්ය මණ්ඩලය
රෙදෙපැ නිදර්ශන ඒකකය (MIU)
ලිපිකාර හා අනුද්දිය සේවා
ප්‍රකාශනාලය
රජයෙහි සහකාර ප්‍රකාශනාලාධිපති
සහකාර ප්‍රකාශනාලාධිපති
ලිපිකාර හා අනුද්දිය සේවා
මූල්‍ය
නිලධාරී මූල්‍යාධිකාරී
ජ්‍යෙ.ක. මූල්‍යාධිකාරී/මූල්‍ය
සහකාර මූල්‍යාධිකාරී/ මූල්‍ය
ලිපිකාර හා අනුද්දිය සේවා
පරිගණක අංශය
ජ්‍යෙ.ක.ලේ. විභාග
සහ. ලේ. විභාග
ලිපිකාර හා අනුද්දිය සේවා
ජ්‍යෙ.ක.ලේ. සාමාන්‍ය පාලන
සහ. ලේ. සාමාන්‍ය
ලිපිකාර හා අනුද්දිය සේවා
සාමාන්‍ය පාලන
නිලධාරී ශ්‍රේණිධිකාරී
ජ්‍යෙ.ක.ලේ. අධ්‍යයන
සහ. ලේ. අධ්‍යයන
ලිපිකාර හා අනුද්දිය සේවා

1.කළමනාකරණ මණ්ඩලය

කළමනාකරණ මණ්ඩලය ප්‍රධාන විධායක කමිටුව මෙන්ම පරිපාලන අධිකාරියද වෙයි.

මහාචාර්ය සේනක රාජපක්ෂ. අධ්‍යක්ෂක, පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය
මහාචාර්ය චාන්දනී වනිගතුංග නියෝජ්‍ය අධ්‍යක්ෂක, පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය
මහාචාර්ය ලක්ෂ්මන් රත්නායක **(සභාපති)** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික
එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද මිය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් නම්කල නියෝජිත
එස්. ජානක ශ්‍රී චන්ද්‍රගුප්ත , ලේකම්/සෞඛ්‍ය
හිරන්සා කලුතන්ත්‍රි මිය මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් නම්කල නියෝජිත
වෛද්‍යාචාර්ය අසේල ගුණවර්ධන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
මහාචාර්ය වජිර එච්. ඩබ්. දිසානායක. කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත
මහාචාර්ය වසන්ති පින්ටෝ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත
මහාචාර්ය වසන්ත දේවසිරි රුහුණු විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත
මහාචාර්ය එම්. ජී සත්‍යදාස් යාපනය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත
මහාචාර්ය ආර්. සී. ප්‍රනාන්දුපුල්ලේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත
මහාචාර්ය එස් .ජේ. ද එස්. හේවාවිසෙන්ති, කැළණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත
මහාචාර්ය එම්. උමාකාන්ත් නැගෙනහිර විශ්ව විද්‍යාලයේ සෞඛ්‍ය උපස්ථාන වෛද්‍ය විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත
මහාචාර්ය එස්. එච්. සිරිබද්දන, රජරට විශ්ව විද්‍යාලයේ වෛද්‍ය සහ අනුබද්ධ විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත
මහාචාර්ය එෆ්. ආර්. ප්‍රනාන්දු මොරටුව විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත
මහාචාර්ය ඒ.එම්. අට්ටිගල්ල, පේරාදෙණිය විශ්ව, විද්‍යාලයේ දන්ත වෛද්‍ය විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත
මහාචාර්ය එස්. ජී. යසවර්ධන ශ්‍රී ජයවර්ධනපුර විශ්ව, විද්‍යාලයේ දන්ත වෛද්‍ය විද්‍යා පීඨය මගින් නම්කල නියෝජිත
මහාචාර්ය එස්.ඩී. ජයරත්න විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික
මහාචාර්ය ජයන්ත ජයවර්ධන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික
මහාචාර්ය නන්දදේව සමරසේකර. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික
වෛද්‍යාචාර්ය හර්ෂ කබ්රාල්. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික
මහාචාර්ය අර්ජුන ද සිල්වා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික
මහාචාර්ය අර්ජුන ද සිල්වා. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික
රාජන් ආසිර්වාදම් මයා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික
පාලක සභාව මගින් නම්කල නියෝජිත
මහාචාර්ය එස්. කරුණාරත්න, සභාව මගින් නම්කල නියෝජිත
වෛද්‍යාචාර්ය රන්ජන් ඩයස්, තෝරා පත්කල සාමාජික

2. සම්පත් හා සිසුන් පිළිබඳව විස්තර

පාඨමාලාව	පුහුණු ලාභීන් සංඛ්‍යාව	සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය
පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලා	24	*
පශ්චාත් උපාධි ඩිප්ලෝමා	449	*
එම්. එස්. සී	233	*
පූර්ව එම්.ඩී සහ එම්. ඩී I කොටස	1623	*
පශ්චාත් එම්.ඩී (දේශීය)	983	*
එම්.ඩී (විදේශීය)	760	*
මණ්ඩල සහතිකකරණ	199	
එකතුව	**4272**	

*ක්ෂේත්‍ර විශේෂඥයින්ගේ සේවය බාහිර කථිකාචාර්යවරුන් ලෙස ලබාගනු ලැබේ

3.දේශීය සිසුන් පිළිබඳව විස්තර

පාඨමාලාව	2020 කාණ්ඩය	පළමු වසර	දෙවන වසර	තෙවන වසර	සිවුවන වසර	පස්වන වසර	හයවැනි වසර	එකතුව
ගපශ්චාත් උපාධි සහතික පත්‍ර	19	24						24
පශ්චාත් උපාධි ඩිප්ලෝමා	217	410	39					449
එම්. එස්.සී.	106	192	41					233
සේවාස්ථ/1 කොටස	45	48	36					84
පූර්ව එම්.ඩී.	507	507	507	392	133			1539
පශ්චාත් එම්.ඩී (දේශීය)					748	221	14	983
එතෙර පුහුණු සඳහා ගොස් පැමිණි සහ නොමැති					395	268	97	760
මණ්ඩළ සහතිකකරණය ලත්							199	199
එකතුව	**894**	**1181**	**623**	**392**	**1276**	**489**	**310**	**4271**

4. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

පීඨය/ශාඛාව	විෂයය/විෂය ක්ෂේත්‍රය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	කථිකාචාර්ය (පරිවාස) සහකාර කථිකාචාර්ය	උපදේශක	වෛද්‍ය	ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	අධ්‍යක්ෂ	01							
	නියෝජ්‍ය අධ්‍යක්ෂ		01						
වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය	සායනික විද්‍යා			01					
	රසායනාගාර විද්‍යා			01					
	සායනික විද්‍යා සහ රසායනික විද්‍යා			02					
	වෛද්‍ය අධ්‍යාපනය			01		01			
වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය	ජෛව විද්‍යා විඥාපනවේදය පිළිබඳව විශේෂ අවධානයක් යොමුකරමින් වෛද්‍ය අධ්‍යාපනවේදය.			01					
	තාවකාලික පර්යේෂණ සහායකු							01	
පුස්තකාලය	ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති								02

5. අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳව තොරතුරු

පීඨය/ශාඛාව	පරිපාලන	අධ්‍යයන සහාය	තාක්ෂණික කාර්ය මණ්ඩලය	ලිපිකරු සහ සමාන්තර	සුළු සේවක
අධ්‍යක්ෂක කාර්යාලය	-	-	-	01	-
අතිරේක රෙජිස්ට්‍රාර් කාර්යාලය	01	-	-	01	-
සාමාන්‍ය පරිපාලන	01	-	-	09	09
පරිගණක ඒකකය	-	03	01	-	-
වෛද්‍ය නිදර්ශන ඒකකය	-	-	01	-	-
වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය	-	-	-	02	01
මූල්‍ය	01	-	-	09	02
විභාග	03	-	-	21	03
අධ්‍යයන	02	-	-	15	04
පුස්තකාලය	-	-	-	07	05

6. පර්යේෂණ නව සොයාගැනීම් සහ ප්‍රකාශන පිළිබඳව විස්තර

විෂයය	භාරදීම්
පර්යේෂණ සහ ප්‍රකාශන සංඛ්‍යාව	22
උපාධි නිබන්ධන සහ විද්වත් රචනා සංඛ්‍යාව	64
සිද්ධි අධ්‍යයන සංඛ්‍යාව	63
පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව (පශ්චාත් එම්. ඩී.)	06
ලිපි සහ පත්‍රිකා සංඛ්‍යාව	-
එකතුව	**155**

7. ආරම්භ කරන ලද නව පාඨමාලාවන් පිළිබඳව විස්තර

- රසායනාගාර අනුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩළ සහතිකකරණය (විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අනුමැතිය අපේක්ෂිත)

8. පුනරාවර්තන වියදම් පිළිබඳව විස්තර

විෂයය	2022 රුපියල්	2021 පුනප්‍රකාශිත රුපියල්
පුද්ගල පඩිනඩි	188,223,679	180,735,847
ගමන් වියදම්	2,650,484	3,120,091
සැපයුම්	15,619,410	14,070,550
නඩත්තු වියදම්	7,337,549	10,197,502
ගිවිසුම්ගත සේවාවන්	79,687,792	56,050,714
වෙනත් මෙහෙයුම් වියදම්	160,903,378	113,003,322
පශ්චාත් උපාධි පුහුණු වියදම්	67,624,637	47,051,968
පාරිතෝෂික සැපයීම	(5,291,725)	6,005,220
එකතුව	**516,755,203**	**430,235,213**

9. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තරය

විෂයය	2022 රුපියල්	2021 පුනප්‍රකාශිත රුපියල්
ගෘහභාණ්ඩ සහ උපකරණ අත්කර ගැනීම	10,872,613	17,116,471
විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ අත්කර ගැනීම	29,200,287	13,157,576

ග්‍රන්ථ සහ වාර සඟරා අත්කර ගැනීම	-	248,077
ගොඩනැගිලි සඳහා එකතු කිරීම්	37,291,379	3,394,402
වෙනත් (උපාධි ලෝගු)	-	-
වෙනත් (අස්පෘශ්‍ය වත්කම්)	997,441	24,000
වෙනත් (විදුලි බෙදාහැරීම)	-	-
එකතුව	**78,361,719**	**33,940,526**

10.මූල්‍ය ප්‍රගතිය පිළිබඳව විස්තර (වියදම්)

විෂයය	රජයේ ප්‍රධානයන් 2022	උත්පාදිත ආදායම 2022	වියදම 2022
පුනරාවර්තන වියදම් ව්‍යාපෘතිය	35,000,000	481,755,203	516,755,203
ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘතිය - අත්පත්කරගත් වත්කම්			
- පිළිසකර කිරීම් සහ නඩත්තු - රොඩ්නි වීදියේ ගොඩනැගිල්ල රඳවා තබාගත් මුදල්	-	78,361,720	78,361,720
එකතුව	**35,000,000**	**560,116,923**	**595,116,923**

11. මූල්‍ය ප්‍රගතිය පිළිබඳව විස්තර (උත්පාදිත ආදායම)

ආදායම් මූලාශ්‍රය	2022 ප්‍රතිපාදන රුපියල්	2022 එකතු වූ මුදල රුපියල්	හිඟය/අතිරික්තය රුපියල්
පශ්චාත් උපාධි අධ්‍යයන	475,900,000	482,688,411	6,788,411
වෙනත්	118,316,000	127,640,273	9,324,273
එකතුව	**594,216,000**	**610,328,684**	

12. මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය 2022

විෂයය	සූත්‍රය	සිසුවකු සඳහා වූ වියදම (රුපියල්)
එක් සිසුවකු/ සිසුවියක සඳහා වූ පුනරාවර්තන වියදම (RE)	සිසුන්/ සිසුවියන් සංඛ්‍යාව (RE)	120,991.61
එක් සිසුවකු/සිසුවියක සඳහා වූ ප්‍රාග්ධන වියදම (CE)	සිසුන්/ සිසුවියන් සංඛ්‍යාව(CE)	18,347.39

13. 2022 වසරේදී ලැබුණු යටිතල පහසුකම් පිලිබඳ විස්තර

යටිතල පහසුකම් විස්තර	වියදම රුපියල්	කාර්ය ප්‍රගතිය
1. උතුරු කොටසේ ගොඩනැගිල්ලෙහි අධ්‍යයන අංශයේ ලේඛණාගාරය සඳහා වානේ රාක්කයක් සපයාගැනීම සහ සවිකිරීම	477,600.00	සම්පූර්ණ කරන ලදී
2. අධ්‍යයන මධ්‍යස්ථානයේ රසායනාගාරය සඳහා මල නොබඳින වානේ නාම පුවරු සවිකිරීම.	367,500.00	සම්පූර්ණ කරන ලදී
3. පශ්චාත් උපාධී අධ්‍යයනායතනයේ ප්‍රධාන ගොඩනැගිල්ල සඳහා නව දැවමය ආවරණයක් සපයාගැනීම සහ සවිකිරීම.	103,000.00	සම්පූර්ණ කරන ලදී
4. PGIM ප්‍රධාන පරිශ්‍රයේ ප්‍රධාන ගේට්ටුව සැකසීම සහ සවිකිරීම .	460,000.00	සම්පූර්ණ කරන ලදී
5. PGIM හි උතුරු කොටසේ ගොඩනැගිල්ලෙහි දෙවන මහලේ වැසිකිළියෙහි ජල කාන්දුව පිළිබඳව සොයා බැලීම සහ අලුත්වැඩියාව	493,878.00	සම්පූර්ණ කරන ලදී
6. PGIM ප්‍රධාන පරිශ්‍රයේ ආපන ශාලා පරිශ්‍රයේ පිරිදෝ බේසම අලුත්වැඩියා කිරීම.	60,000.00	සම්පූර්ණ කරන ලදී
7. ප්‍රධාන පරිශ්‍රයේ දොර වීදුරුවක් ප්‍රතිස්ථාපනය.	38,900.00	සම්පූර්ණ කරන ලදී
8. උතුරු කොටසේ ගොඩනැගිල්ලෙහි දෙවන මහලේ අධ්‍යාන අංශයේ ලේඛණාගාරය සඳහා ඇලුමිනියම් බිත්ති කබඩයක් සපයාගැනීම සහ සවිකිරීම.	378,200.00	සම්පූර්ණ කරන ලදී
9. ප්‍රධාන පරිශ්‍රයේ බිඳවැටී තිබුණු පියගැටපෙළ පිළිසකර කර ස්ථාවර කිරීම.	250,000.00	සම්පූර්ණ කරන ලදී
10. PGIM ප්‍රධාන පරිශ්‍රයේ ප්‍රධාන ගොඩනැගිල්ල තීන්ත ආලේප කිරීම.	2,028,688.00	සම්පූර්ණ කරන ලදී
11. ප්‍රධාන ගොඩනැගිල්ලේ වැසි ජලය අපහරණ මාර්ගය දිය කාන්දු නොවන සේ පිළිසකර කිරීම.	440,150.00	සම්පූර්ණ කරන ලදී
12. PGIM හි උතුරු කොටසේ ගොඩනැගිල්ල සඳහා පොලිකාබනේට් වහලයක් සපයාගැනීම සහ සවිකිරීම.	403,200.00	සම්පූර්ණ කරන ලදී
13. අධ්‍යක්ෂ මණ්ඩල කාමර අංක 01 හි බිත්ති කබඩය අලුත් වැඩියා කිරීම.	245,650.00	සම්පූර්ණ කරන ලදී
එකතුව	**5,746,766.00**	

14. වෙනත් තොරතුරු

14.1 ආයතනික ක්‍රියාකාරකම්

14.1.1. ලියාපදිංචි කිරීම්

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2022 වසර තුළ අධ්‍යයන මණ්ඩල 23 ක සහ විශේෂඥ මණ්ඩල 33 ක සහ අන්තර් විශේෂඥ මණ්ඩළ 4 ක සෘජු අධීක්ෂණය යටතේ එම්.ඩී, මණ්ඩළ සහතිකකරණ, ශාස්ත්‍රපති, පී.ජී ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර යන ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි පාඨමාලාවන් 141 ක් පවත්වනු ලැබිනි.

එම්.ඩී.උපාධි , මණ්ඩළ සහතිකකරණ, ශාස්ත්‍රපති, පී.ජී ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර යන ක්ෂේත්‍රයන්හි උපාධි පාඨමාලාවන් සඳහා පුහුණු වැඩසටහන් සඳහා නවක සිසුන් 894 ක් ඇතුලත් සමස්තයක් ලෙස 4271 ක් වූ පශ්චාත් උපාධි පුහුණුලාභීන් සංඛ්‍යාවක් බඳවා ගනු ලැබිනි. ඔවුන් අතරින් පුහුණුලාභීන් 3552 දෙනෙකු දේශීය වශයෙන් පුහුණුව ලබන අතර 719 දෙනෙකු විදේශයන්හි වන පිළිගත් පුහුණු මධ්‍යස්ථානයන්හි පුහුණුව ලබති.

14.1.2. අධ්‍යයන අවධාරණය

2022 වසරේ අධ්‍යයන අවධාරණය කේන්ද්‍රගත වූයේ නව පුහුණු වැඩසටහන් හඳුන්වාදීම, ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විෂය මාලාවන් සමග ප්‍රමිතිගත වෙමින් සහ නව ශිල්පක්‍රම අන්තර්ග්‍රහණය කරගනිමින් පවතින පුහුණු වැඩ සටහන් සහ උපාධි ප්‍රකාශ පත්‍ර ප්‍රතිශෝධනය කරගැනීම මගින් ඒවායේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම කෙරෙහිය.

මෙම වසරේදීද එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, සිංගප්පූරුව, ඉන්දියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව නෝර්වේ රාජධානිය සහ නවසීලන්තය යන රටවල පිහිටි විශිෂ්ට මධ්‍යස්ථානයන්හි සිදුකරන එම්.ඩී. උපාධි පරීක්ෂණවල බාහිර විභාග පරීක්ෂකයන්ගේ වාර්තාවන්හි සඳහන් නිර්දේශ පදනම් කරගෙන පුහුණුකරුවන් සහ විභාග පිළිතුරුපත්‍ර පරීක්ෂකයන් නව ශිල්පක්‍රම වලින් සන්නද්ධ කිරීමට මෙන්ම විභාග ආකෘතිපත්‍ර වල තත්ත්වය ඉහළ නැංවීම සහ පුහුණු වැඩසටහන්වල සහ විභාගවල පිළිගතහැකි ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ඔවුනට උචිත මාතෘකා ඔස්සේ වැඩමුළු මාලාවක් පවත්වන ලදී.

14.1.3. පශ්චාත් උපාධි පුහුණුලාභීන් සඳහා සාමාන්‍ය රෙගුලාසි සහ මාර්ගෝපදේශ

2021 වසරේදී ප්‍රකාශයට පත් කරන ලද පශ්චාත් උපාධි පුහුණුලාභීන් සඳහා සාමාන්‍ය රෙගුලාසි සහ මාර්ගෝපදේශ පිළිබඳව වූ ලේඛණය 2022 වසරේ ජනවාරි මස සිට ක්‍රියාත්මක කළ හැකිවන පරිදි 2021 වසර තුළදී කළමනාකරණ මණ්ඩලය/සෙනේට් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණ අන්තර්ගත කරගනිමින් සංශෝධනය කරනු ලැබිනි.

14.1.4. පුහුණුකරුවන් විභාග පරීක්ෂකවරුන් සහ අධීක්ෂකවරුන් සඳහා පොදු රෙගුලාසි සහ මාර්ගෝපදේශ

පුහුණුකරුවන් විභාග පරීක්ෂකවරුන් සහ අධීක්ෂකවරුන් සඳහා පොදු රෙගුලාසි සහ මාර්ගෝපදේශ පිළිබඳව වන 2021 දී ප්‍රකාශයට පත් කරන ලද ලියවිල්ල කළමනාකරණ මණ්ඩලය සහ සනාථන සභාව විසින් ගනු ලැබූ තීරණ අන්තර්ග්‍රහණය කරගනිමින් 2021 වසරේ සංශෝධනය කරන ලද්දේ 2022 ජනවාරි මස සිට බලාත්මක කිරීම සඳහාය.

වගුව - 1

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2022 වසර තුළදී ක්‍රියාත්මක කරනු ලැබූ අධ්‍යයන වැඩසටහන්

අධ්‍යයන මණ්ඩල	**සහතිකපත්‍ර/ඩිප්ලෝමාවන්/ශාස්ත්‍රපති/උපාධි/උපවිශේෂයන්**
නිර්වින්දනවේදය	නිර්වින්දනවේදය පිලිබඳ කුසලතා සහතිකය
	නිර්වින්දනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	පහත ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ පුහුණුවක් සහිතව නිර්වින්දනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	හෘත් උරස්ථ නිර්වින්දනවේදය
	ස්නායුවේද නිර්වින්දනවේදය
	ප්‍රසවවේද නිර්වින්දනවේදය
	ළමා චිකිත්සක නිර්වින්දනවේදය
	දැඩි සත්කාර
	වේදනා කළමනාකරණය
	ඉන්ද්‍රිය බද්ධ කිරීම් සහ උග්‍රාවස්ථා උපස්ථානය
මූලික වෛද්‍ය විද්‍යාවන්	කායවාවච්ඡේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	වෛද්‍ය විද්‍යා භෞතවේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
ප්‍රජා වෛද්‍ය විද්‍යාව සහ ප්‍රජා දන්ත චිකිත්සාව	ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. එස්. සී. උපාධිය
	ප්‍රජා දන්ත චිකිත්සාව පිළිබඳව එම්.එස්.සී. උපාධිය
	ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	ප්‍රජා දන්ත චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
සායනික අර්බුදවේදය	වේදනා නාශක වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	සායනික අර්බුදවේදය එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	සායනික අර්බුදවේදය එම්.ඩී උපාධිය සහ පහත ක්ෂේත්‍රයන්හි මණ්ඩල සහතිකකරණය
	ළමා චිකිත්සක අර්බුදවේදය
	රක්තවේද අර්බුදවේදය

අධ්‍යයන මණ්ඩල	**සහතිකපත්‍ර/ ඩිප්ලෝමා/ශාස්ත්‍රපති උපාධි/උපාධි/ උප විශේෂයන්**
දන්ත ශල්‍යවේදය	රෝහල් දන්ත පිළිවෙත පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	සාමාන්‍ය දන්ත පිලිවෙත පිලිබඳව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	මුඛ හා හනුවක්ත්‍ර ශල්‍ය චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	විකලාංග දන්ත චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	පුනර්ජීවන දන්ත චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	මුඛ ව්‍යාධිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
චර්මවේදය	චර්මවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
පවුල් වෛද්‍ය විද්‍යාව	පවුල් වෛද්‍ය විද්‍යාව පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය උපාධි නිබන්ධනය මගින් (නව බඳවාගැනීම් නොමැත)
	පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය - සායනික පුහුණුව මගින්
වෝහාරික වෛද්‍ය විද්‍යාව	වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය
	වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	පහත ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ පුහුණුවක් සහිතව වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	සායනික වෝහාරික වෛද්‍ය විද්‍යාව
	වෝහාරික ධූලකවේදය
	වෝහාරික ළමා චිකිත්සක සහ නවජන්මවේදී ව්‍යාධිවේදය
	වෝහාරික පටක ව්‍යාධිවේදය
	වෝහාරික මානව විද්‍යාව
	වෝහාරික විකිරණවේදය

අධ්‍යයන මණ්ඩළ	**සහතිකපත්‍ර/ ඩිප්ලෝමා/ශාස්ත්‍රපති උපාධි/උපාධි/ උප විශේෂයන්**
වෛද්‍ය විද්‍යාව	ක්ෂය රෝගය සහ ළය රෝග පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	වයෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	සාමාන්‍ය වෛද්‍යවිද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	සාමාන්‍ය වෛද්‍යවිද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ පහත ක්ෂේත්‍රයන්හි මණ්ඩල සහතිකකරණය
	වැඩිහිටි හෘත් වේදය
	හෘත් විද්‍යුත් භෞතවේදය
	අන්තෝසර්ගවේදය
	ඡඨර අන්ත්‍ර විද්‍යාව
	වෘක්කවේදය
	ස්නායුවේදය
	සායනික ස්නායු භෞතවේදය
	ශ්වසන වෛද්‍ය විද්‍යාව
	සන්ධිප්‍රදාහය සහ පුනරුත්ථාපනය
	පුනරුත්ථාපන වෛද්‍ය විද්‍යාව
	වයෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
වෛද්‍ය පරිපාලනය	වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්. එස් සී උපාධිය
	වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
ක්ෂුද්‍රජෛවවේදය	වෛද්‍ය ක්ෂුද්‍රජෛවවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	වෛද්‍ය ක්ෂුද්‍රජෛවවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය ක්ෂුද්‍රජෛවවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ දිලීර අධ්‍යයනය පිළිබඳව මණ්ඩල සහතිකකරණය

අධ්‍යයන මණ්ඩල	**සහතිකපත්‍ර/ ඩිප්ලෝමා/ශාස්ත්‍රපති උපාධි/උපාධි/ උප විශේෂයන්**
	වෛද්‍ය පරපෝෂවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය වයිරසවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
බහුවිෂය ක්ෂේත්‍ර පාඨමාලාවන්	වෛද්‍ය අධ්‍යාපනය පිලිබඳව පශ්චාත් උපාධි සහතිකය
	උග්‍රාවස්ථා උපස්ථාන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	සෞඛ්‍ය ආංශික ආපදා කළමනාකරණය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	වෛද්‍ය ධූලක වේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (මාර්ගගත)
	වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව විශේෂවේදී උපාධිය
	පෙව වෛද්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව එම්. එස්. සී. උපාධිය
	අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. එස්.සී. උපාධිය
	මානව පෝෂණය පිළිබඳව එම්. එස්.සී. උපාධිය
	සායනික ඖෂධ විද්‍යාව සහ චිකිත්සනය පිළිබඳව එම්.එස්.සී. උපාධිය
	වෛද්‍ය ධූලකවේදය පිළිබඳව එම්.එස්.සී. උපාධිය (මාර්ගගත)
	හමුදා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.එස්.සී. උපාධිය
	හදිසි අවස්ථා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව එම්.ඩී. වැඩසටහන සහ මණ්ඩල සහතිකකරණය
	සෞඛ්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව එම්.ඩී. වැඩසටහන සහ මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව එම්.ඩී. වැඩසටහන සහ සායනික ඖෂධ විද්‍යාව සහ චිකිත්සනය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	සායනික පෝෂණය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී. උපාධිය/ නිර්විත්දනවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය සහ උග්‍රාවස්ථා උපස්ථාන වෛද්‍ය විද්‍යාව පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	රසායනාගාර අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය (විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්ෂිත)

අධ්‍යයන මණ්ඩල	**සහතිකපත්‍ර/ ඩිප්ලෝමා/ශාස්ත්‍රපති උපාධි/උපාධි/ උප විශේෂයන්**
නාරීවේදය හා ප්‍රසවවේදය	ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	නාරීවේදය හා ප්‍රසවවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	නාරීවේදය හා ප්‍රසවවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ උපවිශේෂයන්හි මණ්ඩල සහතිකකරණය
	නාරීවේද අර්බුදවේදය
	මඳ සරුබව පිළිබඳ අධ්‍යයනය
	මෛත්‍ර ප්‍රසවවේදය (සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය අපේක්ෂිත)
	භ්‍රෑණ වෛද්‍ය විද්‍යාව (සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය අපේක්ෂිත)
අක්ෂිවේදය	අක්ෂිවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	අක්ෂිවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ පහත ක්ෂේත්‍රයන්හි මණ්ඩල සහතිකකරණය
	දෘෂ්ටිපටල ශල්‍යවේදය
	ළමා චිකිත්සා අක්ෂිවේදය
	පහත ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ පුහුණුවක් සහිතව අක්ෂිවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	කෝර්ණියාව සහ බාහිර අක්ෂි රෝග
	කක්ෂි සහ අක්ෂි පිරිසැකසුම
විකලාංග ශෛල්‍යවේදය	විකලාංග ශෛල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
කර්ණනාසිකස්වරාලවේදය	කර්ණනාසිකස්වරාලවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
ළමා චිකිත්සාව	ළමා සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	ළමා චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	ළමා චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ පහත ක්ෂේත්‍රයන්හි මණ්ඩල සහතිකකරණය

	ළමා චිකිත්සා නව්‍යසූතිවේදය සහ පරිසූතික වෛද්‍යවිද්‍යාව
	ළමා චිකිත්සා හෘත්වේදය
	ළමා චිකිත්සා වෘක්කවේදය
	ළමා චිකිත්සා ස්නායුවේදය
	ළමා චිකිත්සා දැඩි සත්කාරය
	ළමා චිකිත්සා අන්තරාසර්ගවේදය
	ළමා චිකිත්සාව සහ පෙනහළු ආශ්‍රිත රෝග
	ප්‍රජා ළමා චිකිත්සාව
	ළමා චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය / වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ සායනික ජාන විද්‍යාව පිළිබඳව මණ්ඩල සහතිකකරණය
ව්‍යාධිවේදය	පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	සායනික රක්තවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	පටක ව්‍යාධිවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	රසායනික ව්‍යාධිවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	රක්තවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
මනෝ චිකිත්සාව	මනෝ චිකිත්සාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	මනෝ චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	මනෝ චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ පහත ක්ෂේත්‍රයන්හි මණ්ඩල සහතිකකරණය
	වෝහාරික මනෝ විද්‍යාව
	ළමා හා නවයෞවන මනෝ චිකිත්සාව
	වයෝවෘද්ධ මනෝ චිකිත්සාව
	ඇබ්බැහිවීම් පිළිබඳව මනෝ චිකිත්සාව
විකිරණවේදය	සාමාන්‍ය විකිරණවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය

	සාමාන්‍ය විකිරණවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ පහත ක්ෂේත්‍රයන්හි මණ්ඩල සහතිකකරණය
	ළමාචිකිත්සා විකිරණවේදය
	ස්නායු විකිරණවේදය
	අතරමැදි විකිරණවේදය
ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව	ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	ක්‍රීඩා සහ ව්‍යායාම් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම් ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
ශල්‍යවේදය	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ පහත ක්ෂේත්‍රයන්හි මණ්ඩල සහතිකකරණය
	ශල්‍ය අර්බුදවේදය
	හෘත් උරස්ථ ශල්‍යවේදය
	උරස්ථ ශල්‍යවේදය
	ළමා චිකිත්සක ශල්‍යවේදය
	ප්ලාස්ටික් ශල්‍යවේදය
	මූත්‍ර ශල්‍යවේදය
	වාහිණී ශල්‍යවේදය
	ස්නායු ශල්‍යවේදය
	ළමා චිකිත්සක හෘත් උරස්ථ උරස්ථ ශල්‍යවේදය
	පහත ක්ෂේත්‍රයන්හි විශේෂ අවධානයක් සහිතව ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ සාමාන්‍ය ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ඉහළ ආමාශයික අන්ත්‍ර ශල්‍යවේදය
	Hepato-pancreato-biliary ශල්‍යවේදය
	පහළ ආමාශයික අන්ත්‍ර ශල්‍යවේදය
	වාහිණී ශල්‍යවේදය
	ළය ශල්‍යවේදය

	අන්තරාසර්ග ශල්‍යවේදය
	ක්ෂති ශල්‍යවේදය
	පහත ක්ෂේත්‍රයන්හි විශේෂ අවධානයක් සහිතව ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ ආමාශයික අන්ත්‍ර ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ඉහළ ආමාශයික අන්ත්‍ර ශල්‍යවේදය
	Hepato-pancreato-biliary ශල්‍යවේදය
	Colorectal ශල්‍යවේදය
මෙථුනවේදය	මෙථුනවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	මෙථුනවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය

වගු අංක 02

2022. 12. 31 දින වනවිට එක් එක් අධ්‍යයන වැඩසටහන්හි විවිධ අදියරයන්හි වන සමස්ත පුහුණුලාභීන් සංඛ්‍යාව

අධ්‍යයන වැඩසටහන	නව ලියාපදිංචිවීම්	සේවාස්ථ/ සහතිකපත්‍ර I කොටස	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	එම්. එස්.සී	පූර්ව එම්.ඩී	පශ්චාත් එම්.ඩී. (දේශීය)	විදේශ		2022		එකතුව (1-6)
							වසර 2ක් දක්වා	වසර 2ට වැඩි	ආපසු පැමිණි /මණ්ඩල සහතිකරණය නොලද	මණ්ඩල සහතිකරණය නොලද	
							(අ)	(ආ)	(ඇ)	(ඈ)	
		1		2	3	4	5		6		
වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකය	19	24									24
											0
මානව විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව											0
උග්‍රාවස්ථා උපස්ථාන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව			20								20
ළමා සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව			51								51
පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	87		87								87
වයෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව			7								7
සෞඛ්‍ය ආංශික ආපදා කළමණාකරණය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	16		33								33
රෝහල් දන්ත පිලිවෙත පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	13		33								33
සායනික රක්තවේදය (ව්‍යාධිවේදය) පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	10		30								30
වෛද්‍ය ක්ෂුද්‍ර ජෛවවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	11		24								24

අධ්‍යයන වැඩසටහන	නව ලියාපදිංචිවීම්	සේවාස්ථ/ සහතිකපත්‍ර I කොටස	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	එම්. එස්.සී	පූර්ව එම්.ඩී	පශ්චාත් එම්.ඩී. (දේශීය)	විදේශ		2022		එකතුව (1-6)
							වසර 2ක් දක්වා	තෙවන වසර	අපසු පැමිණි /මණ්ඩල සහතිකකරණය නොලද්	මණ්ඩල සහතිකකරණය නොලද්	
							(අ)	(ආ)	(ඇ)	(ඈ)	
		1		2	3	4	5		6		
අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව											
වේදනා නාශක වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	8		14								14
වෛද්‍ය විද්‍යා භෞතවේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව											
මනෝ චිකිත්සාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව											
ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව			10								10
ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	10		10								10
ක්ෂය රෝගය සහ ළය රෝග පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	36		90								90
පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	14		22								22
මෙටුනවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	12		18								18
වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව විශේෂ උපාධිය				4							4

අධ්‍යයන වැඩසටහන	නව ලියාපදිංචිවීම්	සේවාස්ථ/ සහතිකපත්‍ර I කොටස	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	එම්. එස්.සී	පූර්ව එම්.සී	පශ්චාත් එම්.ඩී. (දේශීය)	විදේශ		2022		එකතුව (1-6)
							වසර 2ක් දක්වා	තෙවන වසර	අපසු පැමිණි /මණ්ඩල සහතිකකරණය නොලද්	මණ්ඩල සහතිකකරණය නොලද්	
							(අ)	(ආ)	(ඇ)	(ඈ)	
		1		2	3	4	5		6		
ජෛව විදහ විඥාපනවේදය පිළිබඳව එම් එස් සී උපාධිය	18			44							44
ප්‍රජා දන්ත චිකිත්සාව පිළිබඳව එම් එස් සී උපාධිය	6			9							9
ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම් එස් සී උපාධිය	27			76							76
සායනික ඖෂධ විද්‍යාව සහ චිකිත්සනය පිළිබඳව එම්.එස්.සී. උපාධිය				6							6
වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව විශේෂවේදී උපාධිය	4			7							7
මානව පෝෂණය පිළිබඳව එම්.එස්.සී. උපාධිය	25			52							52
වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්.එස්.සී. උපාධිය	26			26							26
අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.එස්.සී. උපාධිය											0
වෛද්‍ය ධූලකවේදය පිළිබඳව එම්.එස්.සී. උපාධිය											0
හමුදා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.එස්.සී. උපාධිය				9							9
සේවාස්ථ සායනික අර්බුදවේදය	4	6									6

අධ්‍යයන වැඩසටහන	නව ලියාපදිංචිවීම්	සේවාස්ථ/ සහතිකපත්‍ර I කොටස	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	එම්. එස්.සී	පූර්ව එම්.ඩී	පශ්චාත් එම්.ඩී. (දේශීය)	විදේශ		2022		එකතුව (1-6)
							වසර 2ක් දක්වා	තෙවන වසර	අපසු පැමිණි /මණ්ඩල සහතිකකරණය නොලද්	මණ්ඩල සහතිකකරණය නොලද්	
							(අ)	(ආ)	(ඇ)	(ඈ)	
		1		2	3	4	5		6		
රසායනික ව්‍යාධිවේදය පිළිබඳව එම් ඩී උපාධිය 1 වන කොටස	9	22									22
පටක ව්‍යාධිවේදය පිළිබඳව එම් ඩී උපාධිය 1 වන කොටස	14	37									37
වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම් ඩී උපාධිය 1 වන කොටස	8	8									8
අක්ෂිවේදය පිළිබඳව එම් ඩී උපාධිය පළමුවන අදියර	10	11									11
නිර්විඳ්දනවේදය පිළිබඳව එම් ඩී උපාධිය	42				103	55	77	11	9	15	270
රසායනික ව්‍යාධිවේදය පිළිබඳව එම් ඩී උපාධිය	4				19	18	5	1	1	1	45
ඝායනික අර්බුදවේදය පිළිබඳව එම් ඩී උපාධිය	2				12	5	12	2	3	2	36
ඝායනික පෝෂණය පිළිබඳව එම් ඩී උපාධිය	22				44	26	17			6	93
ප්‍රජා දන්ත චිකිත්සනය පිළිබඳව එම් ඩී උපාධිය	3				6	3	7		2	0	18
ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම් ඩී උපාධිය	8				41	24	38	2	1	6	112
චර්මවේදය පිලිබඳව එම් ඩී උපාධිය	5				16	9	6			3	34
හදිසි අවස්ථා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය	16				52	67	38	2		10	169

අධ්‍යයන වැඩසටහන	නව ලියාපදිංචිවීම්	සේවෝස්ථ/ සහතිකපත්‍ර I කොටස	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	එම්. එස්.සී	පූර්ව එම්.ඩී	පශ්චාත් එම්.ඩී. (දේශීය)	විදේශ		2022		එකතුව (1-6)
							වසර 2ක් දක්වා	වසර 2ක් ඉක්මවා	අපසු පැමිණි /මණ්ඩල සහතිකකරණය නොලද	මණ්ඩල සහතිකකරණය නොලද	
							(අ)	(ආ)	(ඇ)	(ඈ)	
		1		2	3	4	5		6		
පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය	16				38	7	3			1	49
වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම් ඩී උපාධිය					20	12	1			0	33
වයෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම් ඩී උපාධිය	2				8	7	2			0	17
රක්තවේදය පිළිබඳව එම් ඩී උපාධිය	11				27	21	13	1	2	7	71
සෞඛ්‍ය විඥාපනවේදය පිළිබඳව එම් ඩී උපාධිය	8				28	19	14			9	70
පටක ව්‍යාධිවේදය පිළිබඳව එම් ඩී උපාධිය	14				35	24	18	1		1	79
වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව එම් ඩී උපාධිය					0	1				0	1
වෛද්‍ය පරිපාලනය පිළිබඳ එම් ඩී උපාධිය	21				40	19	21		1	7	82
වෛද්‍ය ක්ෂුද්‍රජෛවවේදය පිළිබඳව එම් ඩී උපාධිය	11				29	22	11	1	2	5	70
වෛද්‍ය පරපෝෂවේදය පිළිබඳව එම් ඩී උපාධිය					1	1	2			0	4
වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම් ඩී උපාධිය	90				244	263	128	16	4	45	700
නාරිවේදය හා ප්‍රසවවේදය පිළිබඳව එම් ඩී උපාධිය	30				117	16	26	3	5	11	178
OMF ශල්‍යවේදය පිළිබඳව එම්. ඩී උපාධිය	6				21	3	9			3	36
අක්ෂිවේදය පිළිබඳව එම් ඩී උපාධිය	10				41	21	18	2		8	90
මුඛ ව්‍යාධිවේදය පිළිබඳව එම් ඩී උපාධිය					0	0	1			0	1
මුඛ ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය					0	0	1			1	2
විකලාංග දන්ත චිකිත්සාව පිළිබඳව එම් ඩී උපාධිය	5				12	4	5			0	21
විකලාංග ශෛල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය	9				43	18	7	2		1	71

අධ්‍යයන වැඩසටහන	නව ලියාපදිංචිවීම්	සේවාස්ථ/ සහතිකපත්‍ර I කොටස	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	එම්. එස්.සී	සූර්ය එම්.ඩී	පශ්චාත් එම්.ඩී. (දේශීය)	විදේශ		2022		එකතුව (1-6)
							වසර 2ක් දක්වා	තෙවන වසර	ආපසු පැමිණි /මණ්ඩල සහතිකකරණය නොලද්	මණ්ඩල සහතිකකරණය නොලද්	
							(අ)	(ආ)	(ඇ)	(ඈ)	
		1		2	3	4	5		6		
කර්ණනාසිකස්වරාලවේදය පිළිබඳව එම් ඩී උපාධිය					6	11	3	1		2	23
ළමා චිකිත්සනය පිළිබඳව එම් ඩී උපාධිය	48				152	104	58	10	2	14	340
මනෝ චිකිත්සනය පිළිබඳව එම් ඩී උපාධිය	18				78	24	25	4	2	11	144
විකිරණවේදය පිළිබඳව එම් ඩී උපාධිය	23				106	42	26	3	6	3	186
පුනර්ජීවන දන්ත චිකිත්සාව පිළිබඳව එම් ඩී උපාධිය	5				11	4	3		1	2	21
ක්‍රීඩා හා ව්‍යායාම් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම් ඩී උපාධිය	11				23	6	2			0	31
ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය	49				128	110	32	6		21	297
පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම් ඩී උපාධිය	6				17	7	6			3	33
මෙථුනවේදය පිළිබඳව එම් ඩී උපාධිය	12				17	7	11			1	36
වෛරසවේදය පිළිබඳව එම් ඩී උපාධිය					4	3	2	3		0	12
එකතුව	894	108	449	233	1539	983	648	71	41	199	4271

සටහන

(අ) : 2022/12/31 වනවිට වසර 2ක කාලයක් තුළ විදේශ පුහුණු ලබමින් සිටින පුද්ගලයන්

(ආ): 2022/12/31 වනවිට වසර 3 වැනි වසර විදේශ පුහුණු ලබමින් සිටින පුද්ගලයන් (2020, 2021 සහ 2022 යන වසරවලදී නික්මුණු පුද්ගලයන් අතුරින්)

(ඇ): 2022 වනවිට ආපසු පැමිණ ඇති නමුත් මණ්ඩල සහතිකධාරීත්වය ලබා නොමැති පුද්ගලයන්

(ඈ): 2022 වසරේදී මණ්ඩල සහතිකධාරීත්වය ලද

14.1.5. වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය (MERC)

2022 වසර වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයට තවත් සාර්ථක වසරක් වූ අතර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් මෙහෙයවන ලද වැඩසටහන් රැසක මූලිකත්වය දැරීමේ අවස්ථාව 2022 වසරේදී ද වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයට හිමිවිය.

අධ්‍යයන කටයුතු

වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් සම්බන්ධීකරණය කරනු ලබන පාඨමාලාවන්

බහුවිෂය ක්ෂේත්‍ර අධ්‍යයනය පිලිබඳව අධ්‍යයන මණ්ඩල

1. **වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාව, වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය සහ වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව එම්.ඩී. උපාධියඃ**

   වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාව යනු වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය දක්වා ගමන් කළ හැකි දස මාසික අර්ධකාලීන පාඨමාලාවකි.

   2022 වසරේ වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකපත්‍ර පුහුණුව සඳහා අපේක්ෂකයින් දහනව දෙනෙකු එක්වූහ. 2021 වසරේ පුහුණුලාභීන් අතුරින් පස් දෙනෙකු 2022 වසරෙදී වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකපත්‍ර විභාගය සමත්වූහ

   2022 වසර තුළ පුහුණුලාභීන් තිදෙනෙකු නව උපාධි ප්‍රකාශ පත්‍රය යටතේ වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව ශාස්ත්‍රපති උපාධි වැඩසටහනට එක් වන ලදී.

   එක් පුහුණු ලාභිණියක් 2022 වසර තුළදී තම පශ්චාත් එම්. ඩී. දේශීය පුහුණුව සම්පූර්ණ කළ අතර අනෙක් පුහුණු ලාභීන් දෙදෙනා තම විදේශීය පූර්ව එම්. ඩී පුහුණුව හදාරමින් සිටිති.

2. **වෛද්‍ය ධූලකවේදය පිළිබඳව එම්.එස්.සී. උපාධිය ඃ (නව ඇතුළත්වීම් නොමැත)**

   2022 වසර සඳහා නව කණ්ඩායමක් ආරම්භවූයේ නොමැත. පූර්ව කාණ්ඩයේ පුහුණුලාභීන් අතුරින් පුහුණුලාභීන් තිදෙනෙකු 2022 වසර සඳහා නියමිත වෛද්‍ය ධූලකවේදය පිළිබඳව එම් එස් සී උපාධියේ **II** කොටසට අදාළ විභාගය සමත්වූහ.

1. වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය මගින් පුහුණුලාභීන් උදෙසා 2022 වසරේදී පවත්වනු ලැබූ වැඩමුළු

2022 වසරේදී පහත වැඩමුළු පවත්වන ලදී

1. පර්යේෂණ ක්‍රමවේදයන් පිළිබඳ වැඩමුළු
   අ. 2022 පෙබරවාරි 1,7,8,15,22 සහ මාර්තු 2 සහ 10 - සහභාගීවූවන් ගණන 45
   ආ. 2022 මැයි 23,25,26,27,28,30 සහ 31 - සහභාගීවූවන් ගණන 67
   ඇ. 2022 අගෝස්තු 3, 10, 17, 24, 31 සහ සැප්තැම්බර් 13 - සහභාගීවූවන් ගණන 39
   ඈ. 2022 දෙසැම්බර් 12, 1, 14, 15, 16 සහ 17 - සහභාගීවූවන් ගණන 72

2. වෛද්‍ය වෘත්තියේ යෙදීමේදී එහි ආචාරවිධි සහ වෘත්තීකභාවය සම්බන්ධයෙන් එම්.ඩී. පුහුණුලාභීන් සඳහා වැඩමුළුව
   අ. 2022 ජනවාරි 7, 8, 13, 14, 15, සහ 28 - සහභාගීවූවන් ගණන 69

ආ. 2022 මැයි 13, 14, 20, 21 සහ 24 - සහභාගීවූවන් ගණන 155

ඇ. 2022 ජූලි 22, 23, 29 සහ 30 - සහභාගීවූවන් ගණන 198

ඈ. 2022 නොවැම්බර් 18, 19, 25, 26 සහ දෙසැම්බර් 2 - සහභාගීවූවන් ගණන 192

3. වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව පුහුණු ලාභීන් සහ පුහුණුකරුවන් සඳහා මාසිකව පැවැත්වෙන ආරාධිත දේශනය

	දිනය	මාතෘකාව	සම්පත් දායකයා
1	2022 ජනවාරි 18	සායනික හෝ වෝහාරික විෂ ශරීර ගතවීමේ සිද්ධියකදී නිවැරදි මතයක් ගොඩනැගීම	වෛද්‍යාචාර්ය වී. වී. පිල්ලෛ
2	2022 පෙබරවාරි 28	වඩා හොඳ පශ්චාත් මරණ පරීක්ෂයන් සහ සායනික ඡායාරූපකරණයන්	වෛද්‍යාචාර්ය ඩේවිඩ් සැඩ්ලර්
3	2022 මාර්තු 28	වෝහාරික මානව විද්‍යාවේ නව ප්‍රවණතාවන්	වෛද්‍යාචාර්ය ලුවිස් ෆොන්ඩෙබ්‍රයිඩර්
4	2022 අප්‍රේල් 29	අප්‍රිකාවේ නොඩින්ග් සින්ඩ්‍රෝමය : මානවවාදී වෝහාරික වෛද්‍ය විද්‍යාව භාවිතයෙහි යෙදවීම	මහාචාර්ය මයිකල් එස් පොලනෙන්
5	2022 මැයි 23	එක්සත් රාජධානියේ නව වෛදය පරීක්ෂක පද්ධතියෙහි කාර්ය භාරය : වෛද්‍ය නීතික ගම්‍යමානයන්	මහාචාර්ය ජේසන් පෙයින් ජේම්ස්
6	2022 අගෝස්තු 5	හදිසි අනපේක්ෂිත ස්වාභාවික මරණයක් : ඡායාරූප සහිත රෝග විනිශ්චය පිළිබඳ ප්‍රශ්නාවලියක්	මහාචාර්ය ස්ටෙෆන් කෝර්ඩිනර්
7	2022 අගෝස්තු 27	මහාධමණිය සහ උෂ්ණිෂකපාටය ආශ්‍රිත රෝගය	වෛද්‍යාචාර්ය දිමුත් ගුණවර්ධන
8	2022 සැප්තැම්බර් 29	වෝහාරික ස්නායු ව්‍යාධිවේදය නිදර්ශිත/නිරූපිත සිද්ධි	මහාචාර්ය ක්‍රිස්ටෝපර් එම්. මිල්රෝයි

4. නාරිවේදය හා ප්‍රසව වේදය පිලිබඳව පුහුණුලාභීන් සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන දිනය

i. 1 වන සැසිය – - 2022 අගෝස්තු 17 – සහභාගිවූවන් ගණන 21

ii. 2 වන සැසිය – - 2022 අගෝස්තු 31 – සහභාගිවූවන් ගණන 21

iii. 3 වන සැසිය – - 2022 දෙසැම්බර් 29 – සහභාගිවූවන් ගණන 53

5. නිර්විඳ්දනවේදය සහ උග්‍රාවස්ථා උපස්ථානය පිළිබඳව ජ්‍යෙෂ්ඨ රෙජිස්ට්‍රාර්වරුන් සඳහා සූම් දේශන.

	දිනය	මාතෘකාව	සම්පත් දායකයා
1	2022 ජනවාරි 15	නිර්විින්දනවේදය සහ උග්‍රාවස්ථා උපස්ථානය පිළිබඳව ජ්‍යෙෂ්ඨ රෙජිස්ට්‍රාර්වරුන් සඳහා අනාගත විශේෂඥ වෛද්‍යවරුන් රෝගීන්ගේ රුධිර කළමණාකරණය පිළිබඳව නියෝජිතවරුන් බවට පත්වීමට මාර්ගය සැලසීම පිළිබඳව පුහුණු සැසිය	වෛද්‍යාචාර්ය රමණි පල්ලෙමුල්ල
2	2022 ජනවාරි 17	නිර්විින්දනවේදය සහ උග්‍රාවස්ථා උපස්ථානය පිළිබඳව ජ්‍යෙෂ්ඨ රෙජිස්ට්‍රාර්වරුන් සඳහා ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය උපස්ථාන ක්‍රමවේදය අවබෝධ කරගැනීම පිළිබඳ පුහුණු සැසිය.	වෛද්‍යාචාර්ය එස් ශ්‍රීධරන්
3	2022 අගෝස්තු 6	නිර්විින්දනවේදය සහ උග්‍රාවස්ථා උපස්ථානය පිළිබඳව ජ්‍යෙෂ්ඨ රෙජිස්ට්‍රාර්වරුන් සඳහා ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය උපස්ථාන ක්‍රමවේදය පිළිබඳ පුහුණු සැසිය.	වෛද්‍යාචාර්ය විභාර දසනායක
4	2022 සැප්තැම්බර් 3	ඵලදායී ජර්නලයක් ඇරඹීම සහ පවත්වාගෙන යාම සිදු කරන්නේ කෙසේද යන් පිළිබඳව පුහුණු සැසිය නිර්විින්දනවේදය සහ උග්‍රාවස්ථා උපස්ථානය පිළිබඳව ජ්‍යෙෂ්ඨ රෙජිස්ට්‍රාර්වරුන් සඳහා සමාජයක්	වෛද්‍යාචාර්ය විභාර දසනායක සහ වෛද්‍යාචාර්ය රසාලි සමාලිආරච්චි

6. වෛද්‍ය විශේෂඥයින් සඳහා නායකත්වය සහ කළමණාකරණය පිළිබඳව වූ කෙටි කාලීන පාඨමාලාව - 2022 මාර්තු මස 4 සිට 11 දක්වා - සහභාගී වූවන් ගණන 35
7. ළමා චිකිත්සන පුහුණුලාභීන් සඳහා සන්නිවේදන වැඩමුළුව - 2022 ජනවාරි 5 - සහභාගී වූවන් ගණන 55
8. ප්‍රසව හා නාරිවේදය පිළිබඳව පශ්චාත් එම් ඩී විදේශ පුහුණු වැඩසටහන - සූදානම් වන්නේ කෙසේද සහ අපේක්ෂා කළ යුතු දේ මොනවාද? 2022 ජනවාරි 8 - සහභාගී වූවන් ගණන 23
9. විකිරණවේදය පිළිබඳව එම් ඩී පුහුණුලාභීන් උදෙසා පර්යේෂණ දිනයක් - 2022 මාර්තු 24 - සහභාගී වූවන් ගණන 32.
10. වෝහාරික වෛද්‍ය විද්‍යා පුහුණුලාභීන් උදෙසා පර්යේෂණ නිබන්ධන ලිවීම පිළිබඳව අධ්‍යයන දිනය - 2022 මාර්තු 25 සහභාගී වූවන් ගණන 30
11. තම විදේශ පුහුණුව සඳහා ඕස්ට්‍රේලියාව හෝ එක්සත් රාධානිය වෙත යාමට අපේක්ෂා කරන පශ්චාත් එම් ඩී පුහුණු ලාභීන් උදෙසා වූ වැඩමුළුව - 2022 අප්‍රේල් 27 සහභාගී වූවන් ගණන 233
12. Grand Research Rounds - වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව වූ පශ්චාත් උපාධි පර්යේෂණ සංසදය (PGRF) - 2022 අප්‍රේල් 29 - සහභාගී වවන් ගණන 29
13. "මෝටර් රථ පදවන රියදුරන්ද ඇතුළුව බීමත් පුද්ගලයන් පිළිබඳව වෛද්‍යනෛතික පිරික්සුම" යන මැයින් වූ වැඩමුළුව - 2022 ජූනි 16 - සහභාගී වූවන් ගණන 57
කොළඹ විශ්ව විද්‍යාලය මගින් ගනු ලැබූ තීරණයක් මත පදනම්ව අංක 463 දරණ සෙනෙට් මණ්ඩල රැස්වීම මගින් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලය විසින් සංවිධානය කරන ලද 'වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලය වෙතින් සැපයෙන සේවාවන් සහ සම්පත් පිළිබඳව හඳුන්වාදීමේ වැඩසටහන.' යන මැයෙන් ඉදිරිපත් වූ සංකල්ප පත්‍රිකාව අනුමත කරන ලදී. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුහුණු වැඩසටහන් සඳහා සම්බන්ධවන සියළුම පුහුණුලාභීන් හට විශේෂයෙන්ම තම දෛනික මාර්ගගත සහ භෞතික පුහුණු වල කොටසක් ලෙස පර්යේෂණ විෂය අන්තර්ගත පුහුණුලාභීන් උදෙසා පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතන පුස්තකාලය වෙතින් සැපයෙන සේවාවන් සහ සම්පත් පිළිබඳව හඳුන්වාදීමේ වැඩසටහන අනිවාර්ය වැඩසටහනක් වේ

සමස්තයක් ලෙස 261 ක් වූ පශ්චාත් උපාධි පුහුණුලාභීන් පිරිසක් විද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලය වෙතින් සැපයෙන සේවාවන් සහ සම්පත් පිළිබඳව හඳුන්වාදීමේ වැඩසටහනට සහභාගී වූ අතර එම සියළුම දෙනා හට ඉලෙක්ට්‍රොනික සහතිකයක් ලබාදෙන ලදී.

අනු අංකය	දිනය	සාමාජිකයන් ගණන	විෂය ක්ෂේත්‍රයන්
01	17.01.2022	24	මානව පෝෂණය පිළිබඳව එම් එස් සී උපාධිය
02	26.01.2022	18	වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 9) ළමා චිකිත්සනය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 6) නිර්විඳ්දනවේදය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 1) පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 1) DHDP දන්ත ශෛල්‍යවේදය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 1)
03	23.02.2022	19	වෛද්‍ය ක්ෂුද්‍රජෛවවේදය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 4) ළමා චිකිත්සනය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 11) මානව පෝෂණය පිළිබඳව එම් එස් සී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 1) වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව එම් එස් සී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 2)

			නිර්විින්දනවේදය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 1)
04	11.03.2022	07	වයෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 7)
05	30.03.2022	29	ළමා චිකිත්සනය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 3)
06	26.04.2022	09	ක්‍රීඩා හා ව්‍යායාම් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 2) වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකපත්‍රය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 1) ළමා චිකිත්සනය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 2) SEM පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 1) වෛද්‍ය ක්ෂුද්‍රජෛවවේදය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 3) වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව එම් එස් සී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 1)
07	25.05.2022	6	වෛද්‍ය ක්ෂුද්‍රජෛවවේදය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 3) චර්මවේදය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 3)
08	27 .07. 2022	10	ළමා චිකිත්සනය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 5) පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 1) වෛද්‍ය වෛරසවේදය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 1) වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 3)

09	28.09.2022	14	වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම් එස් සී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 3) වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකපත්‍රය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 2) වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 2) ළමා චිකිත්සනය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 1) වෛද්‍ය ක්ෂුද්‍රජෛවවේදය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 3) වෛද්‍ය වෛරසවේදය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 1) පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 2)
10	13 .10.2022	42	පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ප්ලෝමාව
11	13.10.2022	12	ක්ෂුද්‍රජෛව වේදය පිළිබඳව පශ්චාත් උපාධි ප්ලෝමාව
12	19.10.2022	18	ජෛව වෛද්‍ය විඥාපන විද්‍යාව
13	26.10.2022	13	ළමා චිකිත්සනය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 7) වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම් එස් සී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 3) නිර්වින්දනවේදය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 1) වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකපත්‍රය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 1) වෛද්‍ය ක්ෂුද්‍රජෛවවේදය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 1)
14	21.11.2022	23	විකිරණවේදය පිළිබඳව එම් ඩී උපාධිය
15	30.11.2022	17	ක්ෂුද්‍රජෛවවේදය පිළිබඳව එම් ඩී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 4) වෛද්‍ය විද්‍යා රසායනාගාර තාක්ෂණවේදය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 2)

			වෛද්‍ය අධ්‍යාපනය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 6) වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම් එස් සී උපාධිය (පශ්චාත් උපාධි පුහුණුලාභීන් 5)

14.3.2 ක්ලිනිකල් කී (Clinical Key) දත්ත පද්ධතිය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය විසින් 2019 වසරේ සිට 2022 වසර දක්වා වූ අනුක්‍රමික වසර 3 ක් සඳහා ක්ලිනිකල් කී දත්ත පද්ධතිය වෙත වූ බැඳීම 2022 මැයි මාසයෙන් අවසන් වූ අතර පශ්චාත් උපාධි පුහුණුලාභීන්, පුහුණුකරුවන් සහ විභාග පරීක්ෂකවරුන් ගේ අධ්‍යයන අවශ්‍යතාවයන් සඳහා එහි වෛද්‍ය විද්‍යා සම්පත් සහ දුරස්ථ ප්‍රවේශ පහසුකම බෙහෙවින් ප්‍රයෝජනවත් වූ බැවින් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ඉදිරි අනුක්‍රමික වර්ෂ තුනක් (2022 - 2025) සඳහා ක්ලිනිකල් කී (‘Clinical Key’) දත්ත පද්ධතිය මිලදී ගනු ලැබිනි.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් වාර්ෂිකව වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි වැඩසටහන් 119 කට වැඩි ගණනක් සහ වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි විභාග 139 කට අධික ප්‍රමාණයක් පවත්වනු ලබන අතර, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය හරහා වෛද්‍ය විද්‍යාත්මක සඟරා සහ පෙළපොත් වෙත ප්‍රවේශයන් සැලසීමේ දැඩි අවශ්‍යතාවක් පවතී. ඩිජිටල් මාධ්‍යයෙන් අදාළ පොත්පත් ලබා ගත නොහැකි නම් පමණක් ඊ සම්පත් මිලදී ගැනීම වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රතිපත්තියයි. වාර්ෂිකව කාර්යසාධනය විමර්ශනය කරනු ලැබීමට යටත්ව වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් M/S Elsevier ප්‍රකාශකයන් වෙතින් ක්ලිනිකල් කී (‘Clinical Key’) දත්ත පද්ධතිය වසර තුනක කාලයක් සඳහා (2022 සිට 2025 දක්වා) ඇමරිකානු ඩොලර් 233,449 ක මුදලකට මිලදී ගනු ලැබිනි.

- ක්ලිනිකල් කී පැකේජ සඳහා මිලගණන් කාර්ය ගොණුව පහත දැක්වේ

වසර	**ප්‍රකාශිත මිල ගණන (ඇමරිකානු ඩොලර්)**	**වට්ටම් සහිත මිල ගණන (ඇමරිකානු ඩොලර්)**
පළමු වසර (2019-2020)	**ඩොලර්** 77,755	**ඩොලර්** 74,052
දෙවන වසර (2020-2021)	**ඩොලර්** 81,642	**ඩොලර්** 77,755
තෙවන වසර (2021-2022)	**ඩොලර්** 85,724	**ඩොලර්** 81,642
එකතුව	**ඩොලර්** 245,121	**ඩොලර්** 233,449

14.3.2 (i) ක්ලිනිකල් කී භාවිතා කිරීම පිළිබඳව සංඛ්‍යාලේඛණ – 2022

ClinicalKey Usage Statistics

Content Usage Total	JAN	FEB	MAR	APR	MAY	JUN	JUL	AUG	SEP	OCT	NOV	DEC	YTD
Content Views	3,742	6,646	4,279	2,102	2,258	3,093	2,828	3,356	2,542	6,110	5,896	2,067	44,919
Topic Page Views	834	837	952	607	1,036	999	871	1,162	1,034	652	1,071	367	10,422
PDF Downloads	5,933	9,506	14,154	7,003	3,197	6,968	7,396	19,920	19,394	10,824	10,847	1,784	116,926
Content Prints	14	29	47	9	4	17	15	10	14	10	12	2	183

	JAN	FEB	MAR	APR	MAY	JUN	JUL	AUG	SEP	OCT	NOV	DEC	YTD
Book	2,139	5,031	1,127	917	685	1,066	1,011	1,422	886	4,767	4,026	1,139	24,216
Journal	1,261	1,291	2,758	966	1,336	1,791	1,574	1,650	1,465	1,115	1,651	848	17,706
Clinical Overviews	211	222	281	156	142	149	136	164	143	135	120	45	1,904
Patient Education	3	5	3	4	7	1	0	5	3	15	5	0	51
Medline	43	5	8	0	0	6	1	2	3	0	0	3	71
Multimedia	25	1	11	10	1	11	12	3	6	15	3	0	98
Clinical Trial	5	13	9	6	11	5	8	9	5	4	5	1	81

14.3.3. මාර්ගගත සඟරා සහ මාර්ගගත ග්‍රන්ථ බාගත කිරීම

සමස්තයක් ලෙස 196 ක් වූ මාර්ගගත සඟරා ප්‍රමාණයක් සහ 32 ක් වූ මාර්ගගත ග්‍රන්ථ ප්‍රමාණයක් ක්ලිනිකල් කී මෘදුකාංගය භාවිතා කරමින් 2022 වසර තුලදී බාගත කොට ඇත.

14.3.4 <u>පුස්තකාල ග්‍රන්ථ එකතුව- ග්‍රන්ථ ප්‍රදානයන්</u>

2022 වසර තුළදී ග්‍රන්ථ 46 ක් එකතු කරගනු ලැබිණි ග්‍රන්ථ ප්‍රධානයන් ඒවායේ ප්‍රවේශ අංක සමග පහත දක්වා ඇත.

(පරිත්‍යාගයන්හි වටිනාකම දළ වශයෙන් රු. 46x1000 = 46000/=)

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලය - ග්‍රන්ථ ප්‍රදානයන් 2022

දිනය	පරිත්‍යාග අංකය	ග්‍රන්ථ නාමය	පරිත්‍යාග කරනු ලැබුවේ	ලිපිනය	අයිතම ගණන	දළ වටිනාකම	ප්‍රවේශ අංක
12/01/22	PGIML/Don/0	Hospital Infection Prevention &	ශ්‍රී ලංකා ක්ෂුද්‍රජීවී	ශ්‍රී ලංකා ක්ෂුද්‍රජීවී	2	1000 x	18692

	1/22	Control Manual Hospital Infection Prevention & Control Manual	විශේෂඥයින්ගේ විද්‍යායතනය	විශේෂඥයින් ගේ විද්‍යායතනය		2	18693
02/02/22	PGIML/Don/02/22	National Guidelines clinical management of dengue infection National Guidelines clinical management of dengue infection National Guidelines clinical management of dengue infection	SLMA ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය		3	1000 x 3	18694 18696
17/02/22	PGIML/Don/03/22	Regional Implementation framework for elimination 2021-2022	ලෝක සෞඛ්‍ය සංවිධානය	ලෝක සෞඛ්‍ය සංවිධානය	1	1000x 1	18697
04/03/22	PGIML/Don/04/22	Managing programmes on reproductive, maternal, new born, child and adolescent health Module 1 Managing programmes on reproductive,	ලෝක සෞඛ්‍ය සංවිධානය	ලෝක සෞඛ්‍ය සංවිධානය	3	1000x 3	18698 18700

		maternal, new born, child and adolescent health Module 2					
		Managing programmes on reproductive, maternal, new born, child and adolescent health Module 3					
05/03/22	PGIML/Don/05/22	Management of the dead in disasters and catastrophes	Collage of Forensic Pathology	Collage of Forensic Pathology	1	1000x1	18701
08/03/22	PGIML/Don/06/22	Sri Lanka re-emergence of youth bulge	මහාචාර්ය අයි දි සොල්වා	NCAS	1	1000x1	18702
08/03/22	PGIML/Don/07/22	Notes of Maxillofacial injuries	වෛද්‍යාචාර්ය පරාක්‍රම	Department of OMF Surgery	1	1000x1	18703
04/04/22	PGIML/Don/08/22	Larval Paragonimiasis	ඩබ්. ප්‍රේමදර්ශන මයා	ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය	1	1000x1	18704
04/04/22	PGIML/Don/09/22	SLMA 247 covid Helpline	ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය	ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය	2	1000x2	18705-18706
		SLMA 247 covid Helpline					
04/04/22	PGIML/Don/10/22	Colour Guide picture tests Clinical Medicine	චාන්දනී වනිගතුංග	PGIM	23	1000x22	18713-18735
		Colur Guide HIV					

		infection and Aids					
		Diagnostic picture Tests in cardiology					
		Diagnostic Picture Tests in Dermatology					
		Data Interpretation question and case history MRCP part 2					
		Oxford textbook of medicine 3rd edition					
		MRCP Part 2 revision book					
		Slide Interpretation question MRCP Part 2					
		Self–Assessment Picture Tests Medicine Vol 1					
		Self–Assessment Picture Tests Medicine Vol 2					
04/04/22		Self–Assessment Picture Tests					

		Medicine Vol 3					
		Self–Assessment Picture Tests Medicine Vol 4					
		Antibiotic Guidelines 6th ed.					
		Illustrated case histories of clinical medicine					
		A guide to healthy living your child your family					
		Radiology for the MRCP					
		A guide to the MRCP Part 2					
		Diagnosis in colour Cardiology					
		Radiology cases for the MRCP					
		Colour guide picture tests Imaging					
		Colour Guide Dermatology 2nd edi.					
		Colour guide Ophthalmology					

		2nd edi. Colour guide Ophthalmology 2nd edi.					
06/04/22	PGIML/Don/11/22	Lecture notes in Family Medicine Lecture notes in Family Medicine	මහාචාර්ය නන්දනී ද සිල්වා	කැළණිය විශ්ව විද්‍යාලය	2	1000x2	18736-18737
08/06/22	PGIML/Don/12/22	A Bibliography of Sri Lankan Surgical Research	වෛද්‍යාචාර්ය ඒ. අබේගුණසේකර	වෛද්‍යාචාර්ය ඒ. අබේගුණසේකර	1	1000x1	18738
31/10/22	PGIML/Don/13/22	මරණය මරණ පරීක්ෂණය සහ ලියාපදිංචිය නිහඬ නොවූ සාක්ෂි 1 නිහඬ නොවූ සාක්ෂි 2 නිහඬ නොවූ සාක්ෂි 3 නිහඬ නොවූ සාක්ෂි 4	වෛද්‍යාචාර්ය එස්. කොඩිකාර	වෛද්‍යාචාර්ය එස්. කොඩිකාර	5	1000x5	18739-18743

14.3.5. පර්යේෂණ අරමුණු වෙනුවෙන් නොමිලේ ප්‍රවේශ වියහැකි දත්ත පද්ධති

2022 වසරේදී පුස්තකාලය වෙත UpToDate සහ BMJ යන වෙබ් අඩවි වෙත තාවකාලිකව නොමිලේ ප්‍රවේශය ලැබිණි.

14.3.6. විශ්ව විද්‍යාල පුස්තකාලයන්හි තොග සත්‍යෝක්ෂණ කියාවලිය - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2022

ප්‍රධාන මණ්ඩලයේ සහ අනු කමිටු දෙකක සහභාගීත්වය ඇතිව වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2022 යටතේ විශ්ව විද්‍යාල පුස්තකාලයන්හි තොග සත්‍යෝක්ෂණය සිදු කරන ලදී.

14.3.7. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලය විසින් පවත්වනු ලැබූ වැඩමුළු

පශ්චාත් උපාධි පුහුණුලාභීන් උදෙසා ටර්න්ඉටිඉන් ගිණුම් පහසුකම්

පශ්චාත් උපාධි පුහුණුලාභීන් ඃජෛවවිද්‍යා විඥාපනවේදය, වෛද්‍ය අධ්‍යාපනය, ප්‍රජා වෛද්‍ය විද්‍යාව සහ වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම් එස් සී උපාධි පුහුණුලාභීන් උදෙසා ටර්න්ඉටිඉන් ගිණුම් පහසුකම ක්‍රියාත්මක කිරීම සඳහා 2022 මාර්තු මස 18 වන දින වැඩමුළුවක් පවත්වන ලද අතර ඒ සඳහා පුහුණුලාභීන් 43 දෙනෙකු සහභාගී වූහ. (ශාරීරික ව 22 සහ සූම් තාකෂණය ඔස්සේ 21). මේ සඳහා සම්පත් දායකයන් වශයෙන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍යාචාර්ය පණ්ඩුල සිරිබද්ධන මහතා සහ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපතිනියක වන එම්. පී. පී. දිල්හානි මිය සහභාගී වූහ.

14.3.8. ටර්නිටින් මෘදුකාංගය භාවිතයෙන් රචනා චෞර්‍යය පරීක්ෂාව

14.3.8. (i) <u>රචනා චෞර්‍යය පරීක්ෂාව (සාමාන්‍ය)</u>

2022 වසර තුළදී පශ්චාත් උපාධි පුහුණුලාභීන් විසින් ඉදිරිපත් කරල ලද උපාධි නිබන්ධන, සිද්ධි අධ්‍යයන, පර්යේෂණ යෝජනා සහ පැවරුම් සමස්තයක් ලෙස 3354 ක ප්‍රමාණයක් ටර්නිටින් මෘදුකාංගය භාවිතයෙන් රචනා චෞර්‍යය පිළිබඳව පරීක්ෂාවට ලක්කරන ලදී.

අනු අංකය	මාසය	නිකුත් කරන ලද සමානතා වාර්තාව
01	ජනවාරි	165
02	පෙබරවාරි	258
03	මාර්තු	292
04	අප්‍රේල්	299
05	මැයි	177
06	ජූනි	399
07	ජූලි	280
08	අගෝස්තු	387
09	සැප්තැම්බර්	371
10	ඔක්තෝබර්	279
11	නොවැම්බර්	404
12	දෙසැම්බර්	43
	එකතුව	3354

14.3.8. (ii) රචනා චෞරාය පරීක්ෂාව (අවසන් වාර්තාව)

2022 වසර තුළදී සමස්තයක් ලෙස විභාග අංශය, අධ්‍යයන අංශය, විදේශ අංශය සහ MERC කාර්යාලය වෙතින් යොමු කරන ලද උපාධි නිබන්ධන, සිද්ධි අධ්‍යයන, පර්යේෂණ යෝජනා සහ පැවරුම් 1704 ක ප්‍රමාණයක් ටර්න්ඉට්ඉන් මෘදුකාංගය භාවිතයෙන් රචනා චෞර්‍යය පිළිබඳව පරීක්ෂාවට ලක්කරන ලදී.

රචනා චෞරාය පරීක්ෂාව (අවසන් වාර්තාව)

	මාතෘකාව	අධ්‍යයන අංශය	විභාග අංශය	විදේශ
1	නිර්වින්දනවේදය	76	0	0
2	වෛද්‍ය පරිපාලනය	35	34	0
3	සායනික අර්බුදවේදය	0	5	4
4	වෝහාරික වෛද්‍ය විද්‍යාව	15	35	0
5	වෛද්‍ය අධ්‍යාපනය	0	82	0
6	විකිරණවේදය	66	0	0
7	පවුල් වෛද්‍ය විද්‍යාව	9	0	0
8	මනෝ චිකිත්සනය	0	0	9
9	ප්‍රජා වෛද්‍ය විද්‍යාව/දන්ත චිකිත්සාව	114	74	0
10	උග්‍රාවස්ථා උපස්ථාන වෛද්‍ය විද්‍යාව	4	0	0
11	අක්ෂිවේදය	0	20	8
12	චර්මවේදය	13	0	0
13	මෙථුනවේදය	7	22	2
14	ළමා චිකිත්සනය	60	0	0
15	වෛද්‍ය විද්‍යාව	163	99	0
16	ධූලකවේදය	0	1	0
17	ක්ෂුද්‍ර ජීවවිද්‍යාව	11	9	0

18	සායනික පෝෂණය	17	0	0
19	පුනර්ජීවන දන්ත චිකිත්සාව	0	4	0
20	වෛරසවේදය	0	1	0
21	නාරි හා ප්‍රසවවේදය	20	0	0
22	ENT	13	0	0
23	පටක ව්‍යාධිවේදය	26	0	0
24	ශ්වසන වෛද්‍ය විද්‍යාව	7	0	0
25	ස්නායුවේදය	15	0	0
26	හෘත්වේදය	8	0	0
27	දන්ත චිකිත්සනය	0	0	0
28	ජෛව වෛද්‍ය විඥාපන විද්‍යාව	0	125	0
29	පුනරුත්ථාපන වෛද්‍ය විද්‍යාව	0	0	0
30	රක්තවේදය සහ පුනරුත්ථාපන වෛද්‍ය විද්‍යාව	6	0	0
31	වයෝ වෛද්‍ය විද්‍යාව	3	12	0
32	පරපෝෂවේදය	0	0	0
33	සායනික රක්තවේදය	31	0	0
34	DTCD	40	205	0
35	වෘක්කවේදය	6	0	0
36	පාරවිලයන වෛද්‍ය විද්‍යාව	7	0	0
37	ක්ෂුද්‍රජීව විද්‍යාව	0	0	0
38	දන්ත හනුවේදය	2	2	0
39	අන්තර්සරාගවේදය	14	0	0
40	ප්‍රජනන සෞඛ්‍යය	0	0	0

41	සායනික ඖෂධ විද්‍යාව සහ චිකිත්සනය	0	15	0
42	ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව	0	0	0
43	ශෛල්‍යවේදය	1	0	0
44	ව්‍යාධිවේදය	26	0	0
45	අණුක වෛද්‍ය විද්‍යාව	2	0	0
46	ඡඨර අන්ත්‍ර විද්‍යාව	1	0	0
47	සෞඛ්‍ය ආංශික ආපදා කළමණාකරණය	29	13	0
48	සෞඛ්‍ය විඥාපනවේදය	0	17	0
48	DHDP	0	19	0
49	හමුදා වෛද්‍ය විද්‍යාව	0	9	0
50	හදිසි අවස්ථා වෛද්‍ය විද්‍යාව	4	0	0
51	OMF ශෛල්‍යවේදය	0	8	0
5253	වේදනා නාශක උපස්ථාන වෛද්‍ය විද්‍යාව	14	0	0
	එකතුව	**865**	**816**	**23**

14.3.9 සිද්ධි අධ්‍යයන , සහ උපාධි නිබන්ධයන්හි මෘදු පිටපත් එකතුව

සමස්තයක් ලෙස සිද්ධි අධ්‍යයන , උපාධි නිබන්ධන, උපාධි ප්‍රබන්ධ සහ පර්යේෂණ ව්‍යාපෘති 137 ක් (පශ්චාත් එම් ඩී) පුස්තකාලයේ පවතින ඩිජිටල් සුරක්ෂිතාගාරයට එක් කරනු ලැබීය.

විෂය ක්ෂේත්‍රය	**මෘදු පිටපත් සංඛ්‍යාව**
උපාධි ප්‍රබන්ධ සහ උපාධි නිබන්ධන	
ප්‍රජා දන්ත චිකිත්සනය - එම් ඩී උපාධිය	02
ප්‍රජා දන්ත චිකිත්සනය - එම් එස් සී උපාධිය	02

විෂය ක්ෂේත්‍රය	මෘදු පිටපත් සංඛ්‍යාව
ප්‍රජා වෛද්‍ය විද්‍යාව - එම් ඩී උපාධිය	04
ප්‍රජා වෛද්‍ය විද්‍යාව - එම් එස් සී උපාධිය	21
සෞඛ්‍ය ආංශික ආපදා කළමණාකරණය - ඩිප්ලෝමාව	14
වෛද්‍ය පරිපාලනය - එම් ඩී උපාධිය	11
වෛද්‍ය පරිපාලනය - එම් එස් සී උපාධිය	01
වෛද්‍ය ක්ෂුද්‍රජෛව විේදය- එම් ඩී උපාධිය	05
වෛද්‍ය පරපෝෂ විේදය- එම් ඩී උපාධිය	01
වෛද්‍ය වෛරස විේදය- එම් ඩී උපාධිය	01
මෙථුනවේදය - එම් ඩී උපාධිය	02
සිද්ධි අධ්‍යයන	
වයෝ වෛද්‍ය විද්‍යාව - ඩිප්ලෝමාව (සිද්ධි අධ්‍යයනය)	06
වෛද්‍ය විද්‍යාව - එම් ඩී උපාධිය (සිද්ධි අධ්‍යයනය)	50
මෙථුනවේදය – ඩිප්ලෝමාව (සිද්ධි අධ්‍යයනය)	06
කර්ණනාසිකස්වරාලවේදය(සිද්ධි අධ්‍යයනය)	01
පර්යේෂණ ව්‍යාපෘති පශ්චාත් එම් ඩී	
සාමාන්‍ය වෛද්‍ය විද්‍යාව	03
ළමා චිකිත්සනය	03
අක්ෂිවේදය	01
රසායනික ව්‍යාධිවේදය	01
පටක ව්‍යාධිවේදය	02
එකතුව	**137**

14.3.10 සිද්ධි අධ්‍යයන , සහ උපාධි නිබන්ධයන් ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය

සමස්තයක් ලෙස සිද්ධි අධ්‍යයන සහ උපාධි නිබන්ධන 29 ක් ඩිජිටල්කරණය කරනලදී.

14.3. 11 සිද්ධි අධ්‍යයන සහ උපාධි නිබන්ධයන් ගේ මෘදු පිටපත් අන්තර්ජාලයෙන් කියවීම

අන්තර්ජාලය හරහා කියවීමට හැකි මාදිලියෙන් වන සිද්ධි අධ්‍යයන සහ අපාධි නිබන්ධනයන්ගේ සම්පූර්ණ කොටස වෙත ප්‍රවේශවිය හැකි URL සබඳතාවක් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලය මගින් නිර්මාණය කරන ලදී

14. 3. 12. පුස්තකාල මාර්ගගත ග්‍රන්ථ නාමාවලිය

Koha මාර්ගගත පුස්තකාල ග්‍රන්ථ නාමාවලිය වෙත 523 ක් සහ සහ 103 ක් වූ ඊ ග්‍රන්ථ (ග්‍රන්ථවිද්‍යාත්මක දත්ත) ඇතුළත් කරන ලදී.

14.3.13. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් පවත්වනු ලැබූ විභාගවල පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර

2022 වසරේදී වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් පවත්වනු ලැබූ විභාගවල පසුගිය විභාග ප්‍රශ්නපත්‍ර 65 ක් පශ්චාත් උපාධි වෛද්‍යායතන පුස්තකාලයේ ඩිජිටල් සුරක්ෂිතාගාරයේ තැන්පත් කරනු ලැබ තිබේ.
http://librepository.pgim.cmb.ac.lk/handle/1/2146

14.3.14. **HINARI** දත්ත පද්ධතිය වෙත ප්‍රවේශවීම සඳහා ඉල්ලීම් - 2022

2022 වසරේදී පශ්චාත් උපාධි පුහුණුලාභීන් සහ පුහුණුකරුවන් 239 දෙනෙකු වෙත **HINARI** දත්ත පද්ධතිය වෙත ප්‍රවේශවීමේ අවසරය සපයන ලදී.

14. 3. 15. ලිපි ඉල්ලා සිටීමේ සේවාව

2022 වසරේදී සමස්තයක් ලෙස ලිපි ඉල්ලා සිටීම් 690 ක් පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා පුහුණුලාභීන් , පුහුණුකරුවන් සහ උපදේශකවරුන් විසින් සිදු කර ඇත. ලිපි 765 කට වැඩි ගණනක් මෙම ඉල්ලුම්කරුවන් වෙත යවා ඇත.

14. 3.16. පොත් බැඳීම

2022 වසර තුළදී සමස්තයක් ලෙස පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයට අයත් ලිපිද්‍රව්‍ය සහ පුස්තකාල ලිපිද්‍රව්‍ය (පොත්, ජර්නල, පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර, වාර්ෂික වාර්තා, මූල්‍ය වාර්තා) 164ක් බඳින ලදී.

බැඳීම් විධිය	**සම්පූර්ණ කරන ලද පෙත් ගණන**
සම්පූර්ණ බැඳීම	පුස්තකාල එකතුව = 110 මුදල්/ මූල්‍ය අංශය = 37
අර්ධ බැඳීම	පුස්තකාල එකතුව 17
එකතුව	164

9. පුස්තකාල කමිටු රැස්වීම

2022 මාර්තු මස 30 සහ දෙසැම්බර් මස 15 දිනයන්හිදී පුස්තකාල කමිටු රැස්වීම් දෙකක් පවත්වන ලදී. මෙම රැස්වීම් දෙකෙහිම මුලසුන හොබවන ලද්දේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකාව වන මහාචාර්ය චාන්දනී වනිගතුංග මහත්මිය සහ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයකු වන වෛද්‍යාචාර්ය ජී. ඒ. රාජකරුණා මයා විසිනි.

14.3.18 පුස්තකාල ප්‍රකාශන (මාර්ගගත ප්‍රකාශන)

1982 - 2012 වසර අතර කාලයෙහි වූ උපාධි ප්‍රබන්ධ සහ උපාධි නිබන්ධන ඇතුළත් විස්තරාත්මක ග්‍රන්ථ නාමාවලිය සැකසීම පුස්තකාලය විසින් සිදු කරන ලදී.

14.3.19. පර්යේෂණ

- එම් පී . පී. දිල්හානි මිය සහ චන්දිමා වාදසිංහ මිය (2022) ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකයන්හි සේවයේ නිරත වෛද්‍ය නිලධාරීන් විසින් වෛද්‍ය විද්‍යා තොරතුරු වෙත ප්‍රවේශවීමේදී මුහුණදෙන ගැටළු .සමීක්ෂණය ,විශ්වවිද්‍යාල පුස්තකාලාධිපතිවරුන්ගේ සංගමයේ 12 වන ජාත්‍යන්තර සමුළුව. iඟරාව 24(2), pp.138–173. DOI: http://doi.org/10.4038/jula.v24i2.8050

- එම් පී . පී. දිල්හානි මිය , රිස්කා ඉෂාන් මිය චන්දිමා වාදසිංහ මිය සහ පණ්ඩුල සිරිබද්දන මයා (2022), ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් සැපයෙන ලිපි ඉල්ලා සිටීමේ සේවාව ඇගයීම. පුස්තකාල පර්යේෂණ පිළිබඳව ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය.

- එම් පී . පී. දිල්හානි මිය සහ චන්දිමා වාදසිංහ මිය (2022), වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෛද්‍ය විද්‍යා විශේෂඥයින් අතර ක්ලිනිකල් කී දත්ත පද්ධතිය හරහි වෛද්‍ය විද්‍යාත්මක තොරතුරු භාවිතා කිරීමේ රටාවන්, ශ්‍රී ලංකා පුස්තකාලාධිපතිවරුන්ගේ සංගමයේ සඟරාව 25(1), pp එම් පී . පී. දිල්හානි මිය.1–26. DOI: http://doi.org/10.4038/jula.v25i1.8051

- එම් පී . පී. දිල්හානි මිය , ඒ මුණසිංහ මයා, එස් සමරකෝන් මයා (2022) සෞඛ්‍ය සේවාවන්හි බ්ලොක්චේන් තාක්ෂණය භාවිතය (Blockchain in Healthcare), Springer Nature 978-3-031-14590-2

14.3.20 පුස්තකාල නිබන්ධනය

තොරතුරු ඇගයුම් කරන්නේ නෙසේද යන්න මත පදනම්ව පුස්තකාල නිබන්ධනය වෛද්‍ය විද්‍යා පහ්චාත් උපාධි ආයතන පුස්තකාල වෙබ් අඩවියට උඩුගත කරන ලදී.

14.3.21 PGIM පුස්තකාල සේවා මධ්‍යස්ථාන

පහත දැක්වෙන PGIM සේවා මධ්‍යස්ථාන සඳහා සපයන ලද සේවා සහ සම්පත්

1. පේරාදෙණිය

2. ගාල්ල

3. රජරට

4. යාපනය

5. කුරුණෑගල

6. මඩකළපුව

14.3.22 PGIM සේවා මධ්‍යස්ථානයක් පිහිටුවීම

FC215/4.15- (03.12.2021) සහ BoM (PGIM/DB/FM 215th -05.03.2022) ට අනුව මහනුවර ජාතික රෝහලේ පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා මධ්‍යස්ථානයෙහිදී වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන සේවා මධ්‍යස්ථානයක් 2022.04. 01 දින සිට පිහිටුවන ලදී 2022.04.26 දින HP All in One පරිඝණක 4 ක් ලබාදෙන ලදී.

14.3.23. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාල සේවා මධ්‍යස්ථාන සඳහා අන්තර්ජාල ගාස්තු ගෙවීම – 2022

ශ්‍රී ලංකා ටෙලිකොම් සබඳතාවය : මඩකලපුව , ගාල්ල , යාපනය, අනුරාධපුර

මාසික ගාස්තුව රු. 8890.00/ මාසික භාවිතය 425 GB

මාසය	මඩකලපුව ප්‍රමාණය රුපියල්	ගාල්ල ප්‍රමාණය රුපියල්	යාපනය ප්‍රමාණය රුපියල්	අනුරාධපුර ප්‍රමාණය රුපියල්
ජනවාරි 2022	6083.22	3050.33	3823.33	8890.00
පෙබරවාරි 2022	6083.22	2659.46	694.28	8890.00
මාර්තු 2022	6083.22	3931.52	4344.85	8890.00
අප්‍රේල් 2022	2131.33	2748.44	6083.22	8890.00
මැයි 2022	719.99	3061.11	3802.36	8890.00
ජූනි 2022	719.99	3044.51	බිල්පත ලැබී නොමැත	8890.00
ජූලි 2022	2522.74	2814.57	බිල්පත ලැබී නොමැත	8890.00

මාසය	මඩකලපුව ප්‍රමාණය රුපියල්	ගාල්ල ප්‍රමාණය රුපියල්	යාපනය ප්‍රමාණය රුපියල්	අනුරාධපුර ප්‍රමාණය රුපියල්
අගෝස්තු 2022	6477.50	3141.04	5850.64	8890.00
සැප්තැම්බර් 2022	7372.47	3442.62	7372.47	8890.00
ඔක්තෝබර් 2022	බිල්පත ලැබී නොමැත	3546.73	බිල්පත ලැබී නොමැත	බිල්පත ලැබී නොමැත
නොවැම්බර් 2022	බිල්පත ලැබී නොමැත	4795.95	බිල්පත ලැබී නොමැත	බිල්පත ලැබී නොමැත
දෙසැම්බර් 2022	බිල්පත ලැබී නොමැත	බිල්පත ලැබී නොමැත	බිල්පත ලැබී නොමැත	බිල්පත ලැබී නොමැත

14.3.24. 2022 වසර සඳහා පුස්තකාල ආදායම (මුද්‍රණ, ඡායා පිටපත් සහ ස්කෑන් කිරීමේ සේවාවන් වෙතින්)

2022 වසර සඳහා පුස්තකාල ආදායම රු.7713.00 ක් විය.

14.3.25. නව සාමාජිකයන් 2022

මාසය	පශ්චාත් උපාධි පුහුණුලාභීන්	ඉගැන්වීම් කාර්ය මණ්ඩලය	තාවකාලික	විශේෂ අවසරය මත
ජනවාරි	8			
පෙබරවාරි	20	1		1
මාර්තු	8		1	
අප්‍රේල්	9	1		
මැයි	0		1	
ජූනි	0			
ජූලි	1			
අගෝස්තු	2			

මාසය	පශ්චාත් උපාධි පුහුණුලාභීන්	ඉගැන්වීම් කාර්ය මණ්ඩළය	තාවකාලික	විශේෂ අවසරය මත
සැප්තැම්බර්	6			
ඔක්තෝබර්	18			
නොවැම්බර්	2			
දෙසැම්බර්	4			
එකතුව	78	2	2	1

14.3.26 පුස්තකාල පරිශීලක දත්ත

14.3.26. (i) ප්‍රධාන පුස්තකාලය , අධ්‍යයන මධ්‍යස්ථානය

2022 වසර තුළ පුස්තකාලය පරිශීලනය කළ පාඨකයන් පිළිබඳව තොරතුරු පහත දක්වා ඇත.

මාසය	භාවිතා කළ පුද්ගලයන් ගණන
ජනවාරි	115
පෙබරවාරි	153
මාර්තු	309
අප්‍රේල්	110
මැයි	55
ජූනි	52
ජූලි	4
අගෝස්තු	26
සැප්තැම්බර්	29
ඔක්තෝබර්	79

නොවැම්බර්	73
දෙසැම්බර්	38
එකතුව	1043

14.3.26 (ii) ඊ - පුස්තකාලය, PGIM ප්‍රධාන පරිශ්‍රය

මාසය	භාවිතා කළ පුද්ගලයන් ගණන
ජනවාරි	4
පෙබරවාරි	2
මාර්තු	3
අප්‍රේල්	5
මැයි	2
ජූනි	4
ජූලි	3
අගෝස්තු	2
සැප්තැම්බර්	3
ඔක්තෝබර්	6
නොවැම්බර්	2
දෙසැම්බර්	4
එකතුව	40

14.3.27. කාර්යමණ්ඩල සංවර්ධනය

2022 ඔක්තෝබර් මස 27 වන දින කොළඹදී පැවති විශ්වවිද්‍යාල පුස්තකාලාධිපතිවරුන්ගේ සංගමයේ ජාත්‍යන්තර සමුළුව (ICULA) සඳහා එම් පී . පී. දිල්හානි මිය සහ චන්දිමා වාදසිංහ මිය සහභාගී වූහ.

14.3.28. පර්යේෂණ කටයුතු සඳහා වන සෙනට් සම්මානය 2020 සහ 2021

2002 නොවැම්බර් මස 16 වැන දින කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අංශයේ මහාචාර්ය වී. කේ.සමරනායක ශ්‍රවණාගාරයෙහිදී පැවැත්වුණු, 2022 වර්ෂය සඳහා වූ කොළඹ විශ්ව විද්‍යාලයීය වාර්ෂික පර්යේෂණ සමුළුවෙහිදී ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලිධිපතිනිය වන චන්දිමා වාදසිංහ මිය විසින් පර්යේෂණ කටයුතු සඳහා වන සෙනට් සම්මානය දිනා ගන්නා ලදී.

14.3.29. පුස්තකාල තොරතුරු තාක්ෂණ සහකාර II ශ්‍රේණිය තනතුර සඳහා උසස් වීම

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලයේ පුස්තකාල තොරතුරු තාක්ෂණ සහකාර III ශ්‍රේණිය යටතේ සේවය කරන ඒ.එච්.ටී.එච්. ආර්. නිකේතනී මිය සහ ඩබ්. එම්. එන්.එම්. වනිගසේකර මිය 2020.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පුස්තකාල තොරතුරු තාක්ෂණ සහකාර II ශ්‍රේණිය වෙත උසස්වීම් ලැබූහ.

14.3.30. කාර්යමණ්ඩල සංවර්ධණ පුහුණු සඳහා සහභාගීවීම (නේවාසික) PGIM පුස්තකාල කාර්ය මණ්ඩලය

- පුස්තකාල ඊ පහසුකම ඵලදායීව භාවිතය, බෙදාහැරීම සහ හුවමාරුකරගැනීම 2022 ජූලි 20 සහ 2021 නොවැම්බර් 22.
- එදිනෙදා රාජකාරි කටයුතු ඵලදායීව සිදුකරන්නේ කෙසේද, 2002 ජනවාරි 04.

14.3.31. පුස්තකාල කාර්ය මණ්ඩල රැස්වීම්

2022 පෙබරවාරි 8 සහ සැප්තැම්බර් 13 යන දිනයන්හිදී PGIM පුස්තකාලයේදී කාර්ය මණ්ඩල රැස්වීම් දෙකක් (02) පවත්වන ලදී.

14.4 සාමාන්‍ය පරිපාලනය

2022. 12. 31 වනවිට කාර්ය මණ්ඩල තොරතුරු

සේවා ගණය	වැටුප් කේතය	තනතුර	අනුමත තනතුරු ගණන	සෙවයේ නිරත තනතුරු	පුරප්පාඩු
ප්‍රාථමික					
ප්‍රාථමික- පුහුණු නොවූ	U PL 1	වැඩ සහායක	16	14	2
		පුස්තකාල සහායක	5	3	2
ප්‍රාථමික- පුහුණු වූ	U PL 3	පොත් බඳින්නා	1	1	-
		විදුලි කාර්මික ශිල්පී	1	1	-
		රියදුරු	6	4	2
		ජලනල කාර්මික	1	1	-
ද්විතීය					
කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන	U MN 1	කළමනාකරණ සහකාර	43	36	7
		කළමනාකරණ සහකාර (පොත් තැබීම)	2	2	-
		කළමනාකරණ සහකාර (ගබඩා පාලක)	1	-	1
		කළමනාකරණ සහකාර (සරප්)	1	-	1
		පුස්තකාල තොරතුරු සහකාර	9	6	3
		දුරකථන ක්‍රියාකරු/ පිළිගැනීමේ නිලධාරී	1	1	-
		අධීක්ෂක (නඩත්තු)	2	1	1
කළමනාකරණ සහකාර - තාක්ෂණික	U MT 1	කළමනාකරණ සහකාර - තාක්ෂණික	11	2	9
Associate Officers -Segment 2	U MN 2	වැඩ අධීක්ෂක (සිවිල්)	1	-	1
කාර්ය මණ්ඩල සහායක / සුප්‍රා සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සහායක		ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සහායක (පුස්තකාල සේවා)	1	1	-

	U MN 4	කාර්යාල කළමනාකරණ සහායක/ ජ්‍යෙෂ්ඨ කාර්යාල කළමනාකරණ සහායක	17	17	-
		ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සහායක (දත්ත ඇතුළත් කිරීම)	1	1	-
තෘතීය					
අධ්‍යයන සහායක - දෙවන ගණය	U AS 1	පරිගණක කාර්ය ක්‍රම සම්පාදක	1	1	-
කණිෂ්ඨ විධායක/ අධ්‍යක්ෂ	U EX 1	සහකාර මුල්‍යාධිකාරී	1	-	1
		සහකාර ලේඛකාධිකාරී	3	3	-
අධ්‍යයන සහායක - පළමු ගණය	U AS 2	සහකාර ජාල කළමනාකරු	1	1	-
		පරිගණක කාර්ය ක්‍රම සම්පාදක/ පද්ධති විශ්ලේෂක	1	1	-
ජ්‍යෙෂ්ඨ					
මධ්‍යම ගණයේ විධායක නිලධාරීන්	U EX 2	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	3	3	-
ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්	U EX 2(a)	නියෝජ්‍ය මුල්‍යාධිකාරී	1	1	-
		නියෝජ්‍ය ලේඛකාධිකාරී	1	1	-
කථිකාචාර්ය	U AC 3	කථිකාචාර්ය (පරිවාස) කථිකාචාර්ය (ස්ථිර නොකළ) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	11	7	4
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති	U AC 3	ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති	3	2	1
මහාචාර්ය/ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	U AC 5	නියෝජ්‍ය අධ්‍යක්ෂ	1	1	
		අධ්‍යක්ෂ	1	1	-
ස්ථිර වැටුප		තාවකාල පර්යේෂණ සහකාර	2	1	1
		පාඨමාලා සම්බන්ධීකාරක	4	-	4
		පාඨමාලා අධ්‍යක්ෂක	2	-	2
එකතුව			**156**	**114**	**42**

* Note : One person to the holder basis got appointed to another post

*****අධ්‍යයන නොවන පුරප්පාඩු පිරවීම සඳහා මූලික පියවර ගත් නමුත්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පනවනු ලැබූ තාවකාලික බඳවාගැනීමේ තහනම හේතුවෙන් එම පුරප්පාඩු පිරවිය නොහැකි විය.

14. 4. 2. කාර්ය මණ්ඩලය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ තනතුරු 156 කින් සමන්විත වූ සේවක සංඛ්‍යාවේ තනතුරු 42ක් සමාලෝචිත වර්ෂය තුළ පුරප්පාඩු වී තිබුණි. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පනවනු ලැබූ තාවකාලික බඳවාගැනීමේ තහනම මෙයට මූලික වශයෙන් හේතුවිණි.

<u>නව පත්වීම් - අධ්‍යයන ගණය</u>

14.4.2.1. 2022 වසර තුළදී පහත පත්වීම් සිදු කරන ලදී

ම	තනතුර	දිනය
වෛද්‍යාචාර්ය සී. එල් ද සිල්වා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	01.06.2022
වෛද්‍යාචාර්ය ජී. ඒ. රාජකරුණා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	01.07.2022

<u>නව පත්වීම් - පරිපාලන ගණය</u>

කිසිවෙක් නොමැත

<u>නව පත්වීම් - අධ්‍යයන නොවන ගණය</u>

නම	තනතුර	දිනය
ආර්. එච්. පෙරේරා මයා	අධීක්ෂක නඩත්තු කටයුතු III ශ්‍රේණිය	01.02.2022
කේ. ඒ. ටී. සී රත්නසිරි මයා	කළමනාකරණ සහකාර III ශ්‍රේණිය	15.12.2021

<u>කොන්ත්‍රාත් පදනම/ පැවරුම් පදනම මත සිදුකරන ලද බඳවාගැනීම</u>

නම	තනතුර	දිනය
කේ. ජී.මනෙත් මෙත්සර කප්පාගොඩ මයා	වැඩසටහන් සහකාර	21.02.2022
ඩබ්. විහඟ තත්සර මයා	වැඩසටහන් සහකාර	21.02.2022
හන්සනි එරංගා මෙය	වැඩසටහන් සහකාර	21.02.2022

ඉසුර රණවක මයා	වැඩසටහන් සහකාර	21.02.2022
ජේ. එස්. එම්. පෙරේරා මෙය	බහුකාර්ය සංවර්ධන සහකාර - වැඩ සහායක	21.04.2022
පී. එම්. සෙව්වන්දි මිය	ළමා සුරැකුම් මධ්‍යස්ථාන සහකාර	01.08.2022
අරුණා ක්‍රිස්ටෙලා චන්ද්‍රන් මිය	වැඩසටහන් සහකාර	01.09.2022
ටී. එච්. ෂෙනාලි ෂෙහානා මිය	වැඩසටහන් සහකාර	01.09.2022
එච්. ආර්. නදීජා ප්‍රසාදිනී සමරවීර මිය	වැඩසටහන් සහකාර	01.09.2022

<u>කොන්ත්‍රාත් පදනම/ පැවරුම් පදනම මත සිදුකරන ලද බඳවාගැනීම් අලුත් කිරීම</u>

නම	තනතුර	දිනය
ඩී. එම්. ආරියරත්න මයා	ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල කළමණාකරණ සහායක	01.10.2021 - 28.02.2022 **(කොන්ත්‍රාත් කාලසීමාව 28.02.2022 දිනෙන් අවසන් විය)**
එල්.කේ. වීරගල මෙය	ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සහායක	03.09.2021 - 02.02.2022 07.02.2022 - 06.05.2022 **(කොන්ත්‍රාත් කාලසීමාව 06.05.2022 දිනෙන් අවසන් විය)**
ඩබ්. විහඟ තත්සර මයා	වැඩසටහන් සහකාර	21.02.2022 - 20.07.2022 25.07.2022 - 24.08.2022 **(24.08.2022 දින සේවයෙන් ඉල්ලා අස්වන ලදී)**
අරුණා ක්‍රිස්ටෙලා චන්ද්‍රන් මිය	වැඩසටහන් සහකාර	01.09.2022-31.01.2023 **(26.10.2022 දින සේවයෙන් ඉල්ලා අස්වන ලදී))**

ටී.එච්. අයි. ගයත්‍රී මිය	තාවකාලික පර්යේෂණ සහකාර	06.10.2021 - 05.10.2022 10.10.2022 - 09.10.2023 **(05.12.2022 දින සේවයෙන් ඉල්ලා අස්වන ලදී))**
එම්.ඩී.අයි. පුෂ්පකුමාරි මෙය	කළමනාකරණ සහකාර	01.11.2021 - 31.03.2022 05.04.2022 - 04.07.2022 07.07.2022 - 06.10.2022 11.10.2022 - 10.01.2023 **(15.12.2022 දින සේවයෙන් ඉල්ලා අස්වන ලදී))**
ඩී.කේ.එච්.කේ. කලුආරච්චි මිය	කළමනාකරණ සහකාර	01.11.2021 - 31.03.2022 05.04.2022 - 04.07.2022 07.07.2022 - 06.10.2022 11.10.2022 - 10.01.2023
එස්.වයි. එස්. සමාරගේ මිය	කළමනාකරණ සහකාර	01.11.2021 - 31.03.2022 05.04.2022 - 04.07.2022 07.07.2022 - 06.10.2022 11.10.2022 - 10.01.2023
එල්.ජී.ඩී.එම්.යූ. සමරවික්‍රම මයා	කළමනාකරණ සහකාර	01.11.2021- 31.03.2022 05.04.2022 - 04.07.2022 07.07.2022 - 06.10.2022 11.10.2022 - 10.01.2023
ආර්. එස්.එම්. වීරසිංහ මයා	තාක්ෂණික නිලධාරි (ශ්‍රව්‍ය දෘශ්‍ය)	22.12.2021 - 21.05.2022 25.05.2022 - 24.10.2022 27.10.2022 - 26.01.2023
හංසනී එරංගා මෙය	වැඩසටහන් සහකාර	21.02.2022 - 20.07.2022 25.07.2022 - 24.10.2022 27.10.2022 - 26.01.2023
ඉසුර රණවක මයා	වැඩසටහන් සහකාර	21.02.2022 - 20.07.2022 25.07.2022 - 24.10.2022 27.10.2022 - 26.01.2023

කේ. ජී.මනෙත් මෙත්සර කප්පාගොඩ මයා	වැඩසටහන් සහකාර	21.02.2022 - 20.07.2022 25.07.2022 - 24.10.2022 27.10.2022 - 26.01.2023
ටී. එච්. ෂෙනාලි ෂෙහානා මිය	වැඩසටහන් සහකාර	01.09.2022-31.01.2023
එච්. ආර්. නදීජා ප්‍රසාදිනී සමරවීර මිය	වැඩසටහන් සහකාර	01.09.2022-31.01.2023
එච්. පී අමරතුංග මෙය	ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සහකාර (සරප්)	01.09.2021 - 31.01.2022 03.02.2022 - 02.05.2022 06.05.2022 - 05.08.2022 10.08.2022–09.11.2022 14.11.2022 - 13.02.2023
පී.වී.ජී.යූ. අයි.ඒ. සමරවික්‍රම මිය	කළමනාකරණ සහකාර	17.12.2021 - 16.05.2022 19.05.2022 - 18.08.2022 23.08.2022 - 22.11.2022 25.11.2022 - 24.02.2023
පී.ආර්. එන්. ඩී. පොල්ගම්පොල මිය	කළමනාකරණ සහකාර	24.09.2021 - 23.02.2022 28.02.2022 - 27.05.2022 01.06.2022 - 31.08.2022 05.09.2022 - 04.12.2022 08.12.2022 - 07.03.2023
පී.එම්.සෙව්වන්දි මිය	ළමා සුරැකුම් මධ්‍යස්ථාන සහකාර	01.08.2022 - 31.12.2022 04.01.2023 – 03.04.2023
ආර්.ටී.ඊ.එම්. එම්. පබසරා කුමාරි පුස්සෙගොඩ	කළමනාකරණ සහකාර	30.12.2021 - 29.05.2022 06.06.2022 - 05.11.2022 14.11.2022 - 13.05.2023
එන්. එච්.ජී. ටී. මධුෂානි මිය	තාවකාලික පර්යේෂණ සහකාර	09.11.2021 - 08.11.2022 11.11.2022 - 10.11.2023

* වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් ඉහත කොන්ත්‍රාත් පදනම/ පැවරුම් පදනම මත වන බඳවාගැනීම් සිදු කරන ලද්දේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පනවනු ලැබූ තාවකාලික බඳවාගැනීමේ තහනම සැලකිල්ලට ගනිමිනි.

කාර්ය මණ්ඩල සංවර්ධනය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පහත සඳහන් කාර්ය මණ්ඩලය සමාලෝචනයට ලක්වෙන කාල පරිච්ඡේදය අතරතුර විවිධ වූ පුහුණු වැඩ සටහන් සඳහා සහභාගි කරවා ඇත

නම සහ තනතුර	පුහුණු වැඩසටහනේ නම	පුහුණු ස්ථානය
එල් පී තොටවත්ත මිය	පෞද්ගලික ගොනු කළමණාකරනය පිළිබඳව වැඩමුළුව	
ඩී ඩී එම් ඒ ගුණරත්න මිය	මයික්‍රොසොෆ්ට් ඔෆිස් පිළිබඳ වැඩමුළුව	
එල් එච් තිමේෂා මිය	මයික්‍රොසොෆ්ට් ඔෆිස් පිළිබඳ වැඩමුළුව	
ඩී එස් ඒ එස් එල් සමරසිංහ මිය	මයික්‍රොසොෆ්ට් ඔෆිස් පිළිබඳ වැඩමුළුව	
කේ.ජී.පී.එස්. කුමාරි මෙය	මයික්‍රොසොෆ්ට් ඔෆිස් පිළිබඳ වැඩමුළුව	
ඕ. වී. වාසනා ඩයස් මෙය	මයික්‍රොසොෆ්ට් ඔෆිස් පිළිබඳ වැඩමුළුව	
ආර්. කේ. වී.එම්. රූපසිංහ මයා	මයික්‍රොසොෆ්ට් ඔෆිස් පිළිබඳ වැඩමුළුව	
එස්.එස්. රණසිංහ මයා	මයික්‍රොසොෆ්ට් ඔෆිස් පිළිබඳ වැඩමුළුව	මිලෝදා ඇකඩමි ඔෆ් ෆයිනෑන්ෂියල් ස්ටඩීස් ආයතනය
සී.එම්. ජයකොඩි මයා	මයික්‍රොසොෆ්ට් ඔෆිස් පිළිබඳ වැඩමුළුව	මිලෝදා ඇකඩමි ඔෆ් ෆයිනෑන්ෂියල් ස්ටඩීස් ආයතනය
එම්.එස්.ජයසිංහ මියස	මයික්‍රොසොෆ්ට් ඔෆිස් පිළිබඳ වැඩමුළුව	මිලෝදා ඇකඩමි ඔෆ් ෆයිනෑන්ෂියල් ස්ටඩීස් ආයතනය
එච්.එම්.කේ.එස්.හේරත් මිය	කාර්යසාධන කළමණාකරණය සහ KPI ස්ථාපනය	මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලය

උසස්වීම්

නම සහ තනතුර	උසස්වීම් ලද ශ්‍රේණිය	දිනය
එච්.එන්. එල්. හේවාගම මිය	පුස්තකාල තොරතුරු සහකාර - I ශ්‍රේණිය	10.01.2022 (*19.02.2020)
ඩබ්. එම්. එන්. එම්. වනිගසේකර මිය	පුස්තකාල තොරතුරු සහකාර - I ශ්‍රේණිය	10.01.2022 (*01.04.2020)
ඒ.එච්.ටී. එච්. ආර්. නිකේතනී මිය	පුස්තකාල තොරතුරු සහකාර - II ශ්‍රේණිය	10.01.2022 (*01.04.2020)
ඩී.එන්.ඩී. දිසානායක මිය	කාර්යමණ්ඩල කළමණාකරණ සහකාර	30.05.2022 (*15.09.2021)
එම්.ඩී.කේ. රංග මයා	තාක්ෂණික නිලධාරී - II ශ්‍රේණිය - අ කාණ්ඩය	30.05.2022 (*03.11.2021)
ඩබ්. එන්. එස්. කුමාර මයා	වැඩ සහායක විශේෂ - I ශ්‍රේණිය	31.05.2022 (*01.08.2021)
කේ. සී. ප්‍රදීපිකා මිය	ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩල කළමණාකරණ සහකාර	06.06.2022 (*01.01.2022)
ආර්.ඒ. කේ. දිනිරුක්ෂණ මයා	ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩල කළමණාකරණ සහකාර	06.06.2022 (*22.07.2021)
ඒ. ඩී. සී.උමංගලී මිය	කළමණාකරණ සහකාර - I ශ්‍රේණිය	06.06.2022 (*01.01.2022)
ජී. ඒ. කේ. බන්දුමතී මිය	ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩල කළමණාකරණ සහකාර	06.06.2022 (*22.07.2021)
ජී. එච්. එල්.ඉෂංක මයා	කළමණාකරණ සහකාර - II ශ්‍රේණිය	20.09.2022 (*01.07.2020)
ඩබ්. බී. එස්. බණ්ඩාර මයා	කළමණාකරණ සහකාර - II ශ්‍රේණිය	20.09.2022 (*05.06.2020)

නම සහ තනතුර	උසස්වීම් ලද ශ්‍රේණිය	දිනය
ඩබ්. එම්. සී. එස්. කුමාරි මිය	කළමණාකරණ සහකාර - II ශ්‍රේණිය	20.09.2022 (*01.08.2021)
එච්. එච්. කේ. මධුෂිකා මිය	කළමණාකරණ සහකාර - II ශ්‍රේණිය	20.09.2022 (*05.06.2021)

*** ස්ථාන මාරුව බලාත්මක වන දිනය**

ස්ථාන මාරු

නම	තනතුර	මාරුවීම් ලද ස්ථානය	දිනය
එච්. එන්. එල්. හේවාගම මිය	පුස්තකාල තොරතුරු සහකාර - II ශ්‍රේණිය	පේරාදෙණිය විශ්ව විද්‍යාලය	01.02.2022
එම්. ඩී. කේ රංග මයා	තාක්ෂණික නිලධාරී - II ශ්‍රේණිය - අ කාණ්ඩය	මොරටුව විශ්ව විද්‍යාලය	15.03.2022

<u>උසස්වීම් හේතුවෙන් වූ ස්ථාන මාරු</u>

නම	තනතුර	ස්ථානමාරු ලද ස්ථානය	දිනය
ටී. පුන්‍යමූර්ති මයා	කළමණාකරණ සහකාර - III ශ්‍රේණිය	කොළඹ විශ්ව විද්‍යාලය	15.12.2022

<u>විදේශ නිවාඩු (රාජකාරී)</u>

නොමැත

සප්ත වාර්ෂික නිවාඩු

නම	තනතුර	සප්ත වාර්ෂික නිවාඩු කාලසීමාව
ඩබ්.ඒ. එල්. වික්‍රමසිංහ මෙය	නියෝජ්‍ය මූල්‍යාධිකාරී	01.07.2022 – 10.04.2023
වෛද්‍යාචාර්ය පී. ඒ. සිරිබද්දන මයා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය	10.10.2022 – 09.06.2023

විශ්‍රාම යෑම්

නම	තනතුර	දිනය
ටී.එම්. ටී. ජී.ද සිල්වා මෙය	ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩළ සහායක (දත්ත ඇතුළත් කිරීම)	31.12.2022

ඉල්ලා අස්වීම්

නම	තනතුර	දිනය
පී, රාජපතිරණ මිය	සෞඛ්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව මහාචාර්ය	02.01.2022
එන්. බී. එම්. වලිසිංහ මිය	කළමනාකරණ සහකාර III ශ්‍රේණිය	20.05.2022
නම	**තනතුර**	**දිනය**
කේ.කේ.කුමුදුනී මෙය	වැඩ අධීක්ෂක (සිවිල්) - II ශ්‍රේණිය	29.05.2022
ඩබ්. කේ. එන්. එස්. කුමාරි මිය	සහකාර මූල්‍යාධිකාරී	20.06.2022
ඩබ්. විහඟ තත්සර මයා	වැඩසටහන් සහකාර (කොන්ත්‍රාත් පදනම)	24.08.2022
අරුණා ක්‍රිස්ටෙලා චන්ද්‍රන් මිය	වැඩසටහන් සහකාර	26.10.2022

	(කොන්ත්‍රාත් පදනම)	
ටී.එච්. අයි. ගයත්‍රී මිය	තාවකාලික පර්යේෂණ සහකාර	05.12.2022
එම්.ඩී.අයි. පුෂ්පකුමාරි මෙය	කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත් පදනම)	15.12.2022
ඊ. ඩී. වී. සිල්වා මයා	තාක්ෂණික නිලධාරි (ICT)	26.12.2022

14.5 මූල්‍ය තොරතුරු

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

14.5. 1 වාර්තකිරීමේ අධිකාරිය

වෛද්‍ය වරයන් සඳහා විශේෂඥ පුහුණු සපයන ශ්‍රී ලංකාව තුළ වන එකම ආයතනය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයයි. එය කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ජාතික ආයතනයකි. එය ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක්ව ඇති ආයතනයක් වන අතර එහි පුහුණු වැඩසටහන් අතුරින් කිහිපයක් සඳහා එක්සත් රාජධානියේ "රෝයල් කොලෙජ්" ආයතනයෙන් "සමතා" සහතිකය ලැබී ඇත.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, උසස් අධ්‍යාපන හා පුහුණු අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, මෙරට විශ්ව විද්‍යාලයන්හි වෛද්‍ය පීඨයන් ස වෘත්තීය පාසැල් සමගින් සමීපව කටයුතු කරයි. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමණාකරණ මණ්ඩලය ලෙස සෞඛ්‍ය අමාත්‍යාශයේ සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරුන් , වෛද්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් , සියළුම විශ්වවිද්‍යාලයන්හි කෘත්‍යාධිකාරී වරුන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් නම්කල සාමාජිකයන් නම දෙනෙක් යන රටෙහි පිළිගැනීමට ලක්ව ඇති පුද්ගලයන් අතුරින් වන කිහිප දෙනෙකු කටයුතු කරති.

<u>දැක්ම</u>

රටෙහි සහ කළාපයෙහි සෞඛ්‍ය අවශ්‍යතා ඉටු කිරීම සහ ලෝක සෞඛ්‍ය ක්ෂෙත්‍රය කෙරෙහි දායකවීම් ඉලක්ක කරගනිමින් ඉහළ කාර්යශූරත්වයෙන් යුතු විශේෂඥවරුන් සහ අනෙකුත් වෘත්තීකයන් බිහිකිරීමෙහි සුවිශේෂීතාව සඳහා ජාත්‍යන්තරව පිළිගත් මධ්‍යස්ථානයක් බවට පත්වීම.

<u>මෙහෙවර</u>

ආයතනයේ මෙහෙවර වන්නේ ශ්‍රී ලාංකීය ජනතාවට, කළාපයට සහ ලෝකයට ප්‍රශස්ත සහ මානුෂික සෞඛ්‍ය සත්කාරය සැලසීම වෙනුවෙන් ඉහළම ගුණාත්මකභාවය, ප්‍රවීණත්වය සහ කැපවීම සහිත විශේෂඥවරුන් සහ අනෙකුත් වෘත්තිකයන් බිහිකිරීම සඳහා අවශ්‍ය පශ්චාත් අධ්‍යයන වැඩසටහන් සැලසුම් කිරීම සහ සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය වේ.

14. 5. 1 (i) නිකුත් කිරීම සඳහා බලය දුන් දිනය

කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශය නිකුත් කිරීම සඳහා බලය ලබාදීම 2023, 02, 11 වන දින කළමනාකරණ මණ්ඩලය විසින් සිදු කරන ලදී.

14. 5. 1 (ii) වාර්තා කිරීමට අදාළ කාල පරිච්ඡේදය

ආයතනයේ මූල්‍ය කාල පරිච්ඡේදය 2022 ජනවාරි 01 දින සිට 2022 දෙසැම්බර් 31 දත්වා යන කාලපරිච්ඡේදය ආවරණය කරයි.

14.5.2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සාරාංශය

14.5.2. (i) අනුකූලතාව පිලිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර සහ ඉදිරිපත් කර තිබේ.කෙසේ වුවද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති
බල නොපවත්වන ක්ෂේත්‍රයන්හිදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති භාවිතා කිරීම සිදු කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශයන්ට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය,මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ, සාධාරණත්වයේ වෙනස්කම් සහ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් ඇතුළත් වේ.

14.5.2. (ii) පිලියෙල කිරීමේ පදනම

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සකස් කර ඇති අතර අඛණ්ඩව භාවිතයේ යෙදෙයි, උද්ධමන සාධක මත යථාවත් කිරීමක් සිදු වී නැත. මූල්‍ය ප්‍රකාශනයන්හි, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සාරාංශයේ 2.12 හි වාර්තා කොට ඇති ප්‍රත්‍යාගණන පදනම මත වත්කම්හි පසුකාලීන හඳුනාගැනීම සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සාරාංශයේ 3.4 හි වාර්තා කොට ඇති විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් හැර මෙම මූල්‍ය ගණුදෙනු ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය මත සකස් කර ඇත.

14.5.2. (iii) සංසන්දනාත්මක තොරතුරු

ආයතනය විසින් අනුගමනය කරන ලද සියළුම ගිණුම්කරන ප්‍රතිපත්තීන් පසුගිය වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සමග අඛණ්ඩව භාවිතයේ යෙදේ . වත්මන් වර්ෂයේ සංඛ්‍යා ඉදිරිපත් කිරීමේදී වෙනස්කම් වලට අනුරූපී වීම සඳහා අවශ්‍ය සංසන්දනාත්මක සංඛ්‍යා සකස් කර ඇත

14.5.2. (iv) ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

එක සමාන අයිතමවල එක් එක් ප්‍රමාණාත්මක සමූහය මූල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත. ප්‍රමාණාත්මක නොවන අයිතම හැර වෙනස් ස්වරූප අයිතම හෝ කාර්යයන් වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

14.5.2. (v) හිලව් කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මගින් අවශ්‍ය වන හෝ අවසර ලබා දෙන විට හැර මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් කර නොමැත.

14.5.2. (vi) අඛණ්ඩ පැවැත්ම

PGIM ආයතනය තම අඛණ්ඩව පැවතීමේ හැකියාව තක්සේරු කර ඇත . පූර්වේක්ෂිත අනාගතය තුළදී තම මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ආයතනය සතුව පවතින බවට ආයතනයේ කළමනාකරණ මණ්ඩලයට යුක්තිසහගත අපේක්ෂණයක් වේ. ආයතනයේ අනාගතය පිළිබඳ පවතින සියලු තොරතුරු සලකා බැලීමේදී විශ්ව විද්‍යාලය ඈවර කිරීමේ හෝ මෙහෙයුම් නැවැත්වීමේ අවශ්‍යතාවයක් විශ්ව විද්‍යාලය මගින් පූර්වේක්ෂණය නොකෙරේ. ඒ අනුව , PGIM ආයතනය තම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්මේ පදනම නොකඩවා අනුගමනය කරයි .

14.5.2. (vii) වාර්තාකිරීමේ කාල පරිච්ඡේදයට අනතුරුව සිදුවන සිදුවීම්

වාර්තාකිරීමේ කාල පරිච්ඡේදයට අනතුරුව සිදුවන සිදුවීම් යනු වාර්තාකිරීමේ දිනය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම බලාත්මක කරනු ලබන දිනය යන දිනයන් අතරතුර සිදුවන වාසි සහගත මෙන්ම අවාසි සහගත සිදුවීම් වේ. මේ යටතේ ආකාර දෙකක සිදුවීම් හඳුනාගත හැක.

අ. වාර්තාකිරීමේ කාලසීමාව තුළදී පැවති තත්ත්වයන් පිලිබඳව සාක්ෂි සපයන සිදුවීම් (වාර්තාකිරීමේ දිනයෙන් අනතුරුව ගැලපීම් සිදු කල හැකි සිදුවීම්)

ආ. වාර්තාකිරීමේ දිනයෙන් අනතුරුව පැනනැගි තත්ත්වයන් පිලිබඳව විස්තර දක්වන සිදුවීම් (වාර්තාකිරීමේ දිනයෙන් අනතුරුව ගැලපීම් සිදු කල නොහැකි සිදුවීම්)

වාර්තාකිරීමේ දිනයෙන් අනතුරුව සිදුවූ සැලකියයුතු සිදුවීම් සියල්ලක්ම පාහේ සැලකිල්ලට ගනු ලැබ ඇති අතර මූල්‍ය ප්‍රකාශනයන්හි සුදුසු තැන්වල ගැලපීම් හෝ අනාවරණයන් සිදුකර ඇත.

14.5.2. (viii) සක්‍රීය මුදල් සහ ඉදිරිපත් කිරීමේ මුදල්

PGIM ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අයිතම මනිනු ලබන්නේ PGIM ආයතනය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් (සක්‍රීය මුදල්) භාවිතා කරමිනි. මෙම මූල්‍ය ප්‍රකාශනයන් සකස් කර ඉදිරිපත් කරනු ලබන්නේ PGIM ආයතනයෙහි සක්‍රීය හා ඉදිරිපත් කිරීමේ මුදල් වන . ශ්‍රී ලංකා රුපියල් (Rs.) වලිනි.

14.5.2. (ix) විදේශ මුදල් ගණුදෙනු සහ ශේෂයන්

විදේශ මුදලින් සිදු කළ සියළුම ගනුදෙනු එවැනි ගනුදෙනු සිදු කරන ලද දිනයන්වල පැවති විනිමය අනුපාතික හෝ අයිතම මිනුම් කල තක්සේරුව භාවිතා කරමින් සක්‍රීය මුදල් වෙත පරිවර්තනය කෙරේ. එවැනි ගනුදෙනු පියවීමේ ප්‍රතිඵලයක් වශයෙන් සහ විදේශ මුදලින් දක්වනු ලබන මූල්‍යමය වත්කම් හෝ බැරකම් වලට අදාලව වසර අවසාන විනිමය අනුපාතයන්ගේ පරිවර්තනයනහි ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන විදේශ විනිමය ලාභ සහ අලාභ ආදායම් වාර්තාවෙහි දක්වා තිබේ.

14.5.2 (x) වටැයීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්හි අවසරය ඇති බවට සඳහන් වන අන් අයුරක් පවතී නම් මිස මූල්‍ය ප්‍රකාශනයන්හි වන ප්‍රමාණයන් ආසන්නතම රුපියලට වටයා ඇත.

14.5.2 (xi) අයවැය පාලනයන්

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ශික අයවැය සකස් කොට ඇත්තේ භාණ්ඩාගාරය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් නිකුත් කොට ඇති මූල්‍ය පටිපාටීන්ට සහ මාර්ගෝපදේශයන්ට අනුකූලවය. 2022 වසර තුළදී මහා භාණ්ඩාගාරය වෙතින් නියමිත අයවැය වෙන්කිරීම නොලැබුණු බැවින්වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට එහි වියදම් අභ්‍යන්තරව ජනනය කරන ලද අරමුදලකට සීමා කිරීමට සිදුවිය.
අයවැය මගින් 2022 ජනවාරි මස 1 වන දින සිට 2022 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ මූල්‍ය කාලපරිච්ඡේදය ආවරණය කරයි. අයවැය සම්පිණ්ඩනය පිළිබඳ ප්‍රකාශය සහ තත්‍ය අගයන් උපලේඛණයෙහි අමුණා ඇත.

14.5.2 (xii) දේපළ, පිරියත සහ උපකරණ (PPE)

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දේපළ, පිරියත සහ උපකරණ වලට භූමිය, ගොඩනැගිලි, විද්‍යාගාර සහ ඉගැන්වීම් මෙවලම්, කාර්යාලයීය මෙවලම්, දැවභාණ්ඩ සහ සවිකුරු, පුස්තකාළ ග්‍රන්ථ සහ සඟරා, මෝටර් වාහන, උපාධි ලෝගු යනාදිය ඇතුළත් වේ.

14.5.2 (xii) (අ) හඳුනාගැනීමේ පදනම

වත්කම් හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සම්භාවිතාවයක් පවතින විට හා වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි විට දේපළ පිරියත හා උපකරණ හඳුනා ගැනීම සිදු වේ.

- **මූලික හඳුනාගැනීම**

  දේපළ පිරියත හා උපකරණ මූලික වශයෙන් ඒවා මිලදී ගැනීම සඳහා වැයකල පිරිවැය ද ඇතුළත් වන පරිදි අදාළ වත්කම එයට අදාළ කාර්යයෙහි ලා එහි ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒමේදී සිදුවූ අනෙක් ආනුෂංගික වියදම් ද ඇතුළත්ව හඳුනාගනු ලැබේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව දේපළ , පිරියත හා උපකරණ මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ සමුච්චිත අපහරණ ලාභ අඩු කිරීමෙනි.

- **පවතින දේපළ, පිරියත සහ උපකරණයන්ට අදාළ පසුකාලීන වියදම්**

  ස්පෘෂ්‍ය දේපළ, පිරියත සහ උපකරණයන් මත සිදුවන වියදම්,අදාළ වියදම සිදු කරන ලද කාලසීමාවට අදාල මූල්‍ය ප්‍රකාශයට බැර කරනු ලැබේ. ඒ එම වියදම පහත සඳහන් උපමානයන්ට අදාළ නොවන තෙක් පමණි,එවන් අවස්ථාවන්හිදී අදාළ වියදම ප්‍රාග්ධනීකරණය කරනු ලබන අතර අදාළ ප්‍රයෝජ්‍ය ආයුකාලය තුළදී ක්‍රමක්ෂයට ලක් කරනු ලැබේ.

  - අදාළ වත්කමෙහි ධාරිතාවය ඉහළ යාම

- නිෂ්පාදනයේ ගුණාත්මක භාවය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කිරීම හෝ මෙහෙයුම් පිරිවැය අඩු කිරීම .

- අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම මගින් තහවුරු කරන ලද ආයු කාලයට වඩා වත්කම්වල ආයු කාලය සැලකිය යුතු ලෙස දීර්ඝ කිරීම

- දේපොළ, පිරියත සහ උපකරණයන්හි වෙළඳපොල වටිනාකම පසුකාලීනව ඉහළ යාම.

- මුලින් තක්සේරු කරන ලද කාර්ය සාධන ප්‍රමිතියෙන් බලාපොරොත්තු වන අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිෂ්ඨාපනය කිරීම හෝ පවත්වාගෙන යාම සඳහා දේපළ , කම්හල් සහ උපකරණ අලුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දරන ලද වියදම් , එවන් වියදම් සිදුකල විට විට වියදමක් ලෙස පිළිගැනේ .

- **හඳුනාගැනීමෙන් අනතුරුව වන මිනුම්**

පිරිවැය ආකෘතිය

ඉඩම් , ගොඩනැගිලි , මෝටර් රථ , රසායනාගාර සහ ඉගැන්වීම් උපකරණ , ක්‍රීඩා භාණ්ඩ , වෙනත් උපකරණ සහ ගෘහ භාණ්ඩ සහ උපාංග යන ගණයන් හැර අනෙකුත් සියලුම දේපළ පිරියත හා උපකරණ, හඳුනාගැනීමෙන් පසු එහි පිරිවැයෙන් සමුච්චිත ක්ෂය වීම් අඩුකිරීම මත ගෙන යනු ලැබේ .

ප්‍රත්‍යාගණන ආකෘතිය

100,000.00	වෛද්‍යාචර්ය නලින් රොද්‍රිගෝ පදක්කම් අරමුදල	100,000	
228,595.58	- එම - ජංගම ගිණුම	229,349	329,349

100,000.00	වෛද්‍යාචර්ය පී.ටී. ද සිල්වා පදක්කම් අරමුදල	100,000	
173,882.19	- එම - ජංගම ගිණුම	174,850	274,850
200,000.00	මහාචාර්ය ප්‍රියානි සොයිසා පදක්කම් අරමුදල	200,000	
220,390.90	- එම - ජංගම ගිණුම	225,063	425,063
200,000.00	මහාචාර්ය රිස්වි ෂෙරිෆ්	200,000	
185,368.72	- එම - ජංගම ගිණුම	185,889	385,889
500,000.00	Bio Informatics NOMA	500,000	
360,602.69	- එම - ජංගම ගිණුම	373,548	873,548
500,000.00	Biomedical Informatics NOMA	500,000	
358,102.69	- එම - ජංගම ගිණුම	369,573	869,573
500,000.00	Public Health Informatics NOMA	500,000	
359,302.69	- එම - ජංගම ගිණුම	369,298	869,298
500,000.00	Medical Inform Infomatics NOMA	500,000	
360,602.69	- එම - ජංගම ගිණුම	373,548	873,548
200,000.00	වෛද්‍යාචර්ය ටී ජයවර්ධන රන් පදක්කම්	200,000	
123,750.33	- එම - ජංගම ගිණුම	122,992	322,992
250,000.00	වෛද්‍යාචර්ය උපාලි බානගල රන් පදක්කම්	250,000	
101,798.12	- එම - ජංගම ගිණුම	107,639	357,639
250,000.00	ACEM PGIM රන්පදක්කම් හදිසි අවස්ථා වෛද්‍ය විද්‍යාව	250,000	
66,272.16	- එම - ජංගම ගිණුම	78,591	328,591
250,000.00	මහාචාර්ය දුලිත ෆර්නැන්ඩෝ	250,000	
37,597.60	- එම - ජංගම ගිණුම	37,345	287,345

250,000.00	මහාචාර්ය රෝහන් ජයසේකර පදක්කම් අරමුදල	250,000	
6,123.29	- එම - ජංගම ගිණුම	13,525	263,525
7,565,891.20			**7,636,796**

සටහන

PGIM ආදායම වෙත හුවමාරු කරනු ලැබූ පොලී ආදායම 2021 වසරේදී GR වෙත හර කිරීමෙන් සහ ජංගම ගිනුම වෙත බැර කිරීමෙන් යළි නිවැරදි කරන ලදී.

වෙනත් අනාවරණයන්

අනාවරණය අංක 01

ප්‍රදානය කරන ලද සහ 2022 දෙසැම්බර් මස 31 වනවිට භාණ්ඩ නොලැබුණු කොන්ත්‍රාත් පිලිබඳව විසූතර පහත පරිදි වේ.

ප්‍රාග්ධන

	ඕඩර් අංකය	**අයිතමය**	**වෙළඳ ආයතනයේ නම**	**සමස්ත මිල (15%වැට් බදු සමග)**
1	PGIM/SUP/30/2022- Cap	අධිශීතකරණ (01 කි) Freezer (01 No.)	පී ඇන්ඩ් ටී ට්‍රේඩින් (පෞද්ගලික) සමාගම	2,666,746.50
2	PGIM/SUP/32/2022- Cap	විද්‍යාගාර ඉන්කිව්බේටර (03 කි)	සයන්ටිෆික් ඉන්ස්ටෘමන්ට්ස් (පෞද්.) සමාගම	1,604,250.00
3	PGIM/SUP/32/2022- Cap	තාප වායු උදුන (01කි)	සයන්ටිෆික් ඉන්ස්ටෘමන්ට්ස් (පෞද්.) සමාගම	641,700.00
4	PGIM/SUP/34/2022- Cap	X කිරණ ප්‍රදීපන කාරක (04 කි)	අවොන් ෆාර්මෝ (පෞද්.) සමාගම	161,000.00
5	PGIM/SUP/35/2022- Cap	කැස්පර්ස්කයි බලපත්‍ර (350 කි)	එස්එල් ටෙලිකොම් සර්විසස්	986,125.00
				6,059,821.50

පුනරාවර්තන

	ඕඩර් අංකය	**අයිතමය**	**වෙළඳ ආයතනයේ නම**	**සමස්ත මිල (15%වැට් බදු සමග)**
1	PGIM/SUP/104/2022- Rec	විභාග අයිතම	බයොමෙඩයිට් (පෞද්.) සමාගම	91,655.00
2	PGIM/SUP/105/2022- Rec	විභාග අයිතම	හෙම්සොන්ස් ඉන්ටර්නැෂනල් (පෞද්.) සමාගම	20,579.25
3	PGIM/SUP/106/2022- Rec	විභාග අයිතම	අවොන් ෆාර්මෝ කෙම් (පෞද්.) සමාගම	25,144.75
4	PGIM/SUP/107/2022- Rec	විභාග අයිතම	මයික්‍රොටෙක් බයොලොජිකල් (පෞද්.) සමාගම	134,090.00

5	PGIM/SUP/108/2022- Rec	විභාග අයිතම	හෙම්සොන්ස් ඉන්ටර්නැෂනල් (පෞද්.) සමාගම	57,074.50
6	PGIM/SUP/133/2022- Rec	විභාග අයිතම	බයොමෙඩයිට් (පෞද්.) සමාගම	1,169,932.20
7	PGIM/SUP/134/2022- Rec	විභාග අයිතම	හෙම්සොන්ස් ඉන්ටර්නැෂනල් (පෞද්.) සමාගම	105,898.25
8	PGIM/SUP/135/2022- Rec	විභාග අයිතම	මයික්‍රොටෙක් බයොලොජිකල් (පෞද්.) සමාගම	37,145.00
9	PGIM/SUP/137/2022- Rec	පැපිරස් පත්‍ර	පැපිරස් පේපර්ස් (පෞද්.) සමාගම	71,875.00
10	PGIM/SUP/138/2022- Rec	කලර් ටෝනර් (පැන්තම්)	ඊ විස් පෙරිෆරල්ස් (පෞද්.) සමාගම	234,600.00
				1,947,993.95

අනාවරණය අංක 02

අසම්භාව්‍ය බැඳීම් පහත අනාවරණය කර ඇත

අංකය	සිද්ධිය පිළිබඳ විස්තරය	විෂයය	ප්‍රකාශ	කළමණාකරණයේ සටහන
අසම්භාව්‍ය බැඳීම්				
1	**මහේස්ත්‍රාත් අධිකරණය B 492/01/14** දුමින්ද රොහාන් ගුණරත්න, අනධ්‍යන කාර්ය මණ්ඩලය	මහේස්ත්‍රාත් අධිකරණය	විභාග කරමින් පවතී - අයදුම්කරු පහත සහනයන් අයදුම් කරයි 1. යලි සේවයේ පිහිටුවීම 2. වැටුප් යලි ගෙවීම 3. සාධාරණ වන්දියක්	පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනයට පක්ෂව නඩු තීන්දුවක් ලබා ගැනීම සඳහා කළමනාකාරිත්වය මෙම නඩු පිලිබඳව නිරන්තර අධීක්ෂණය ක නිරත වන අතර නඩුවේ වර්තමාන තත්වය මත වන්දි වටිනාකම ඇස්තමේන්තු කළ නොහැක .
2	**LT 01/Add/20/2016** Mr. Duminda Rohan Gunaratne, Non-Academic Staff	කම්කරු විනිශ්චය සභාව - වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන රැස්වීම් සඳහා ආහාර පාන සැපයීමේදී සුළු මුදල් වලින් ගෙවීම් ලබාගැනීම සඳහා වංචනික බිල්පත් ඉදිරිපත් කිරීම.	මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව අවසන් වනතුරු නඩුව පසෙකින් තබන ලදී.	
3	**උපරිමාධිකරණ HC ALT 43/20** **ආර්. එම්. එම්.බී. රණතුංග මයා ,** **අනධ්‍යන කාර්ය මණ්ඩලය**	උපරිමාධිකරණය (රණතුංග මයා තම ඉහළ බලධාරියාගේ පූර්ව අවසරයකින් තොරව කාර්යාලයෙන් බැහැරට යාම සහ තමා රාජකාරි ස්ථානයේ නොසිටීම ආවරණය කිරීමට නිවාඩු ලේඛණය අයථා ලෙස භාවිතය යන කරුණු මත ඔහුගේ සේවය අත්හිටුවීමට එරෙහි අභියාචනය,	විභාග කරමින් පවතී - අයදුම්කරු පහත සහනයන් අයදුම් කරයි. 1. යලි සේවයේ පිහිටුවීම හෝ යලි සේවයේ පිහිටුවීම වෙනුවෙන් වන සහනයක් 2. සේවය අත්හිටුවන ලද කාලසීමාව සඳහා වන වැටුප් යලි ගෙවීම	

		ඔහුගේ වයස අවුරුදු 63 ක් වන බැවින් ඔහු නැවත සේවයෙහි පිහිටුවිය නොහැක. (ඔහු විශ්‍රාම ගැනීමේ වයස ඉක්මවා ඇත.)	3. අධිකරණය තීරණය කරන ආකාරයේ කවර හෝ සාධාරණ වන්දියක්	

අනාවරණය අංක 03

ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනු

2022 වසර තුළදී ප්‍රධාන කළමණාකරණ නිලධාරීන් හට පහත දක්වා ඇති පරිදි වැටුප් ගෙවනු ලැබ ඇත.

කළමණාකරන මණ්ඩළ සාමාජිකයන්	
කළමණාකරන මණ්ඩලය සඳහා සහභාගීවීමේ ගාස්තුව	1,386,000.00
අධ්‍යයන මණ්ඩල	855,329.89
දේශන සඳහා ගෙවීම්	48,500.00
	2,289,829.89
අධ්‍යක්ෂක	6,061,425.57
නියෝජ්‍ය අධ්‍යක්ෂක	6,089,670.08
නියෝජ්‍ය ලේඛකාධිකාරී	2,639,313.90
නියෝජ්‍ය මූල්‍යාධිකාරී	2,718,971.74
නියෝජ්‍ය මූල්‍යාධිකාරී (වැඩබැලීම)	873,383.98
	20,672,595.16

අනාවරණය අංක 04

මූල්‍ය ප්‍රකාශනයන්හි අයවැය තොරතුරු ඉදිරිපත් කිරීම

අයවැයෙහි සසැඳුම් ප්‍රකාශය සහ තත්‍ය අගය පහත දක්වා ඇත.

රුපියල්

	සංශෝධිත අයවැය 2022	**තත්‍ය (මුදල් පදනම)**	**තත්‍ය (සමුච්චිත පදනම)**
හුවමාරු නොවන ගණුදෙනු වෙතින් වන ආදායම			
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානයන්	130,000,000	35,000,000	35,000,000
හුවමාරු නොවන ගණුදෙනු වෙතින් වන සමස්ත ආදායම - ජංගම	**130,000,000**	**35,000,000**	**35,000,000**

හුවමාරු වන ගණුදෙනු වෙතින් වන ආදායම - ජංගම			
පොලී ආදායම	64,000,000	60,541,000	96,049,734
විවිධ ආදායම්	530,216,000	523,491,000	532,464,149
සමස්ත ආදායම ජංගම	**594,216,000**	**584,032,000**	**628,513,883**
හුවමාරු නොවන ගණුදෙනු වෙතින් වන ආදායම - ප්‍රාග්ධන			
ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානයන්	12,000,000	-	-
හුවමාරු නොවන ගණුදෙනු වෙතින් වන සමස්ත ආදායම - ප්‍රාග්ධන	**12,000,000**	-	-
සමස්ත ආදායම	**736,216,000**	**619,032,000**	**663,513,883**
මෙහෙයුම් වියදම් - ජංගම			
පුද්ගල පඩිනඩි	199,563,000	192,656,000	188,223,679
ප්‍රවාහනය	9,200,000	6,718,000	2,650,484
සැපයුම්	22,000,000	17,236,000	15,619,410
නඩත්තු	10,000,000	5,330,000	7,337,549
ගිවිසුම්ගත සේවා	87,412,000	79,182,000	79,687,792
අනෙකුත් මෙහෙයුම් වියදම්	188,958,000	172,060,000	158,411,137
පශ්චාත් උපාධි පුහුණු වියදම්	70,000,000	68,569,000	67,624,637
පාරිතෝෂික ප්‍රතිපාදනය	6,283,000	6,283,000	(5,291,725)
සමස්ත මෙහෙයුම් වියදම්	**593,416,000**	**548,034,000**	**514,262,962**
	සංශෝධිත අයවැය 2022	**තත්‍ය (මුදල් පදනම)**	**තත්‍ය (සමුච්චිත පදනම)**
මෙහෙයුම් වියදම් - ප්‍රාග්ධන			
ප්‍රාග්ධන වියදම්	142,800,000	83,044,000	110,443,000
සමස්ත මෙහෙයුම් වියදම් - ප්‍රාග්ධන	**142,800,000**	**83,044,000**	**110,443,000**
සමස්ත මෙහෙයුම් වියදම්	**736,216,000**	**631,078,000**	**624,705,962**

අනාවරණය අංක 05

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන පරිශ්‍රය වන (අංක 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07) හි භූමියේ වටිනාකම වන රු. 573, 720,000 (මිලියන පන්සිය හැත්තෑ තුනකුත් හත් ලක්ෂ විසිදහසක) අගය ගිණුම් වාර්තාවන්ට වත්කමක් ලෙස ඇතුළත් කරනු නොලැබූයේ පහත හේතූන් නිසාවෙනි.

1. අදාළ ඉඩම මේ වනතෙක් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නමට නෛතිකව හිමිව නොතිබීම.

2. අදාළ ඉඩමෙහි හිමිකාරීත්වය සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නම් කරනු ලැබීමට කැබින ඵිමණ්ඩල අනුමැති හිමිව තිබුණද, අදාළ පැවරුම් මේ වනතෙක් ලැබී නොතිබීම.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සමග අදාළ හුවමාරු ඔප්පුව ලබාගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කර තිබේ.

අනාවරණය අංක 06

පසුගිය වර්ෂයේදී දැවභාණ්ඩ, උපාංග සහ කාර්යාලයීය මෙවලම් යටතේ වර්ගීකරණය කරන ලද අගය රු. 161,169,651 වූ වත්කම් මෙම වසරේදී පහක දැක්වෙන පරිදි වර්ග තුනකට වෙන් කරනු ලැබිණි.

දැව භාණ්ඩ සහ උපාංග	75,523,258
කාර්යාලයීය මෙවලම්	36,385,105
පරිගණක සහ ජාලකරණ මෙවලම්	49,261,288

2022 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සාධාරණත්වයේ වෙනස්කම් පිලිබඳ ප්‍රකාශය

විස්තරය	සමුච්චිත අරමුදල්- පුනරාවර්තිත	සමුච්චිත අරමුදල්- ප්‍රාග්ධන	ප්‍රත්‍යාගණන සංචිතය	අත්හිටවූ/පරිත්‍යාග කළ අරමුදල්	පොදු සංචිතය	වියදම් කළ ප්‍රාග්ධන ප්‍රතිපාදන	වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන	ත්‍යාග සහ පරිත්‍යාග	ජනනය කරන ලද අරමුදලින් ප්‍රාග්ධන පැහැදුම	සමස්තය
31.12.2020 දිනට ශේෂය	-	-	320,000	11,402,390	164,853,406	1,778,759,994	42,517,524	35,226,256	30,755,938	2,563,835,508
පූර්ව වර්ෂයේ ගැලපුම්	-	-	-	-	(3,537,550)	-	-	-	-	(3,537,550)
බැරකම් අතිරික්ත/ඌන ප්‍රතිපාදන	-	-	-	-	15,343,776	-	-	-	-	15,343,776
වසර තුළ ලැබුණු අරමුදල්	-	-	-	3,538,291	-	-	31,000,000	-	-	34,538,291
ප්‍රත්‍යාගණන අතිරික්තය	-	-	30,500,000	-	-	-	-	-	-	30,500,000
වසර තුළ වියදම් කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන	-	-	-	-	-	32,620,041	(32,620,041)	-	-	-
ජනිත අරමුදලින් ප්‍රාග්දන පැහැදුම වෙත දායකත්වය	-	-	-	-	(18,201,348)	-	-	-	18,201,348	-
පසුගිය වර්ෂයනට අදාළ ගෙවීම්	-	-	-	-	(402,000)	-	-	-	-	(402,000)
පොදු සංචිතයට බැර කරන ලද අවලංගු වූ චෙක්පත්	-	-	-	-	4,764,293	-	-	-	-	4,764,293
ප්‍රාග්ධන ප්‍රදානයන් හි ක්‍රමක්ෂයය	-	-	-	-	-	(92,235,859)	-	-	-	(92,235,859)
අදාළ කාල සීමාව සඳහා අතිරික්ත/ඌන	-	-	-	-	103,730,876	-	-	-	-	103,730,876
31.12.2021 දිනට ශේෂය(යළි ප්‍රකාශ කිරීමට පෙර)	-	-	**30,820,000**	**14,940,681**	**266,551,453**	**1,719,144,176**	**40,897,483**	**35,226,256**	**548,957,286**	**2,656,537,335**
SLPSAS 11 අනුව ප්‍රතිවර්ගීකරණය- සමුච්චිත අරමුදල් පුනරාවර්තනය	266,551,453		-	-	266,551,453)	-		-	-	-
SLPSAS 11 අනුව ප්‍රතිවර්ගීකරණය- සමුච්චිත අරමුදල් පුනරාවර්තනය	-	2,344,225,201	-	-	-	(1,719,144,176)	(40,897,483)	(35,226,256)	(548,957,286)	-
ගැලපුම්-ගොඩනැගිලි සඳහා ඌන ක්‍රමක්ෂයය	(29,844)	-	-	-	-	-	-	-	-	(29,844)
ගැලපුම්-ක්ලිනිකල් කී ක්‍රමක්ෂයය එකතු කිරීම 2019,2020 සහ 2021	11,913,943	-	-	-	-	-	-	-	-	11,913,943
ගැලපුම්-සේවක අර්ථසාධක අරමුදල් ණය සහ ආපදා ණය පියවීම	(354,190)	-	-	-	-	-	-	-	-	(354,190)
ගැලපුම්-2019 සහ 2020 වර්ෂ සඳහා ක්ලිනිකල් කී සාමාජික ගාස්තු	(26,437,004)	-	-	-	-	-	-	-	-	(26,437,004)
ගැලපුම්-2021 වර්ෂය සඳහා ක්ලිනිකල් කී සාමාජික ගාස්තු	(16,880,862)	-	-	-	-	-	-	-	-	(16,880,862)

විස්තරය	සමුච්චිත අරමුදල්- පුනරාවර්තිත	සමුච්චිත අරමුදල්- ප්‍රාග්ධන	ප්‍රත්‍යාගණන සංචිතය	අත්හිටවූ/පරිත්‍යාග කළ අරමුදල්	පොදු සංචිතය	වියදම් කළ ප්‍රාග්ධන ප්‍රතිපාදන	වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන	ත්‍යාග සහ පරිත්‍යාග	ජනනය කරන ලද අරමුදලින් ප්‍රාග්ධන පැහැදූම	සමස්තය
ගැලපුම් - Under depreciation of auditorium chairs	(840,377)	-	-	-	-	-	-	-	-	(840,377)
31.12.2021 දිනට ශේෂය යලි ප්‍රකාශිත	**233,758,203**	**2,344,225,201**	**30,820,000**	**14,940,681**	**-**	**-**	**-**	**-**	**-**	**2,623,744,085**
ගැලපුම් - ගබඩා අත්තිකාරම් ගිණුමෙහි දෝෂ නිවැරදි කිරීම	(219,000)	-	-	-	-	-	-	-	-	(219,000)
ගබඩා අත්තිකාරම් ගැලපුම කපා හැරීම	(293,113)	-	-	-	-	-	-	-	-	(293,113)
පූර්ව වර්ශයෙහි අනුකූලනයන්	32,250	-	-	-	-	-	-	-		32,250
සමුච්චිත වියදම් සඳහා වැඩි ප්‍රතිපාදන	55,660	-	-	-	-	-	-	-	-	55,660
කවුළු තිර ක්‍රමක්ෂයය	517,071	-	-	-	-	-	-	-	-	17,071
ප්‍රත්‍යාගණන අතිරික්තය - දැව භාණ්ඩ, කාර්යාලීය මෙවලම්, විද්‍යාගාර සහ ඉගැන්වීම් මෙවලම්	-	-	22,426,862	-	-	-	-	-	-	22,426,862
ප්‍රත්‍යාගණන අතිරික්තය - විද්‍යාගාර සහ ඉගැන්වීම් මෙවලම්	-	-	8,478,746	-	-	-	-	-	-	8,478,746
ප්‍රත්‍යාගණන අතිරික්තය - මෘදුකාංග	-	-	641,331	-	-	-	-	-	-	641,331
පසුගිය වසරවලට අදාල ගෙවීම්	(1,256,445)	-	-	-	-	-	-	-	-	(1,256,445)
පරිත්‍යාග සහ පරිසීමිත අරමුදල් වල වෙනස්කම්	-	-	-	53,205	-	-	-	-	-	53,205
කාලසීමාව සඳහා අතිරික්තය (හිඟය)	128,573,480	135,548,011)	-	-	-	-	-	-	-	(6,974,530)
31.12.2022 දිනට ශේෂය	**361,168,106**	**2,208,677,190**	**62,366,939**	**14,993,886**	**-**	**-**	**-**	**-**	**-**	**2,647,206,121**


2021 වසර සිට ක්‍රියාත්මක නව රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන්ට අදාළව හුවමාරු නොවන ගනුදෙනු මත අගය හඳුනාගැනීම 2022 වසරේදී අනුගමනකය කරන ලදී . මෙම ප්‍රමිතිය රාජ්‍ය ආයතනවලට 2018 ජනවාරි 1 වනදා සිට බලපවත්වනු ලැබේ. අදාළ ප්‍රමිතීන්හි සංක්‍රාන්තිමය ස්වභාවය හේතුවෙන් මෙම ප්‍රමිතිය භාවිතයෙහි යෙදවීම සඳහා වසර තුනක කාලයක් ලබාදෙන ලදී. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පසුගිය වසර තුනෙහිදී මෙම ප්‍රමිතිය භාවිතා නොකළ බැවින් පූර්වවර්ශයෙහි ගිණුම් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් යළි ප්‍රකාශ කොට ඇත්තේ ගිණුම්කරන ප්‍රතිපත්තින්ට අනුකූලවය. රඳවාගත් ඉපැයුම් මත ඇතිකරන ලද බලපෑම පහත පරිදි වේ.

රඳවාගත් ඉපැයුම්	103,730,876
2021 දෙසැම්බර් මස 31 වනවිට ශේෂය	
අඩුකලා - ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂයය	91,466,409)
එකතුකලා - ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂයය	31,000,000
ගිණුම්කරණ දෝෂ නිවැරදිකිරීම	(354,190)
ගොඩනැගිලි සඳහා අඩු ක්‍රමක්ෂය	(29,844)
ක්ලිනිකල් කී දායකත්ව ගාස්තුව -2021	(16,880,862)
ක්ලිනිකල් කී හි අගය අඩුවීම- 2021	7,184,601
2021 දෙසැම්බර් මස 31 වන දිනට නැවත ප්‍රකාශ කරන ලද රඳවාගත් ඉපැයුම්	**33,184,172**

2021 සිට 2022 දක්වා අභ්‍යන්තරව ජනනය කරන ලද ආදායම

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

	2021	**2022**
ලියාපදිංචි ගාස්තු	35,978,000	40,488,850
ඉගැන්වීම් ගාස්තු	179,335,420	244,379,650
විභාග ගාස්තු	140,197,745	166,504,300
වෙනත්	83,732,956	158,955,884
එකතුව	**439,244,121**	**610,328,684**



15. <u>තිරසර සංවර්ධනය මත පදනම් අනාගත අපේක්ෂාවන් පිළිබඳව වාර්තාව</u>

මනා සෞඛ්‍යසම්පන්න සමාජයක් ඔස්සේ තිරසර සංවර්ධනයක් කරා යාමට ශ්‍රී ලංකාවට ඉඩ සැලසීම සඳහා විශේෂඥ වෛද්‍ය වරුන්ගේ සේවය සංවර්ධනය කිරීම වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අභිප්‍රායයි.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය , තම සම්පත් වඩාත්ම ඵලදායී සහ කාර්යක්ෂම අයුරින් භාවිතා කිරීම ඔස්සේ සහ ගුණාත්මක අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා තම පාර්ශ්වකරුවන් සමග සහයෝගීව වැඩ කිරීම ඔස්සේ තමන් වෙත ලැබුණු මෙම අවස්ථාව භාවිතයට ගනු ඇත. තවද, පවතින සම්පත් රැකගැනීම සහ නඩත්තුව, ගෙවීම සහ ක්ෂය වීම අවම කිරීම මෙන්ම අපතේ යාම වැලැක්වීම සහ එමගින් පවතින සම්පත් ආයතනයේ පාරිභෝගිකයන්/පාර්ශ්වකරුවන් විසින් අනාගතයේදී භාවිතයට ගනු ලැබීම සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සුදුසු පියවර ගෙන තිබේ.

ඒ අනුව අපගේ මූලික අරමුණු වන්නේ විශේෂඥ වෛද්‍ය සේවයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ රටෙහි සෑම පුරවැසියෙකු හටම (ග්‍රාමීය සහ නාගරික) පහසු සහ ඵලදායී මෙන්ම ගුණාත්මක අතින් ඉහළ විශේෂඥ වෛද්‍ය සේවාවන් සැපයීම වේ.

මෙය සාර්ථක කරගැනීමෙහි ලා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, උසස් අධ්‍යාපන තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය යන ආයතන අප ආයතනය සමග එක්ව කටයුතු කරයි. තිරසර සංවර්ධන ඉලක්ක ලඟා කරගැනීම සඳහා අප ආයතනය විසින් නියාමනය කරනු ලබන සන්ධිස්ථාන දෙකක් වේ.

එයින් එක් සන්ධිස්ථානයක් වන්නේ ගුණාත්මක වෛද්‍ය අධ්‍යාපනයක් ලබාදීම ඔස්සේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ ප්‍රමාණය ඉහළ නැංවීමයි. මෙම සන්ධිස්ථානය ලඟා කරගැනීම සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ගුණාත්මක අධ්‍යාපණයක් තහවුරු කිරීම අරමුණු කරගනිමින් සම්මතයන් කිහිපයක් නිර්මාණය කරන ලදී. මෙහිලා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පශ්චාත් උපාධි වැඩසටහන් සහ විෂයමාලා ජාතික මෙන්ම ගෝලීය සෞඛ්‍ය ඉල්ලුමට සරිලන පරිදි සකස් කිරීම පිණිස දැඩිව අධ්‍යයනය සඳහා විවිධ කමිටු ස්ථාපනය සිදු කරනු ලැබිනි.

දෙවැනි සන්ධිස්ථානය වනුයේ විශේෂඥ වෛද්‍ය සේවාවට ප්‍රමුඛස්ථානයක් සලසමින් මෙරට ජනතාවගේ සෞඛ්‍ය සහ ජීවිත අපේක්ෂාවන් ඉහළ නැංවීම සහ ඊට අදළව වයෝ වෛද්‍ය විද්‍යාවට අදළ වැඩසටහන්, මානව පෝෂණ වැඩසයටහන්, ළමා සෞඛ්‍ය වැඩසටහන් වැනි අවශ්‍ය යයි හඳුනාගනු ලැබූ වැඩසටහන් හඳුන්වාදීම වේ. ඊට අමතරව සෞඛ්‍ය සහ ජීවිත අපේක්ෂාමය අංග බොහොමයක් ඇතුළත් වන පරිදි විවිධ පශ්චාත් උපාධි වැඩසටහන්හි විෂයමාලාවන් සංශෝධනය කිරීමද වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් සිදුකරනු ලැබිනි.

රටෙහි සෑම පුරවැසියෙකුටම විශේෂඥ වෛද්‍යවරයන්ගේ සේවාව ලබාගත හැකිවන අන්දමින් පහසුකම් සැලසීම මෙන්ම සියළුම පුරවැසියන්ගේ සෞඛ්‍ය මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් මෙන්ම පුද්ගලයන්ගේ නිරෝගීසම්පන්න ආයුකාලය ඉහළ නැංවීමේ අරමුණින් සියළුම වයස් මට්ටම්හි

ස්ත්‍රීන්ගේ, පුරුෂයන්ගේ මෙන්ම ළමුන්ගේ සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් වෛද්‍යවරුන් හට ගුණාත්මක පශ්චාත් උපාධි වෛද්‍ය අධ්‍යාපනයක් ලබාදීම මගින් ශ්‍රී ලංකාවට පහසුවෙන් තම තිරසර සංවර්ධන ඉලක්කය ලඟාකරගත හැකිවනු ඇත. පශ්චාත් උපාධි වෛද්‍ය අධ්‍යාපනය මගින් වෛද්‍යවරුන් හට තම මූලික වෛද්‍ය අධ්‍යාපනයෙන් අනතුරුව මනා අධීක්ෂණයක් යටතේ තම කුසලතා සංවර්ධනය කරගැනීමේ අවස්ථාව උදාවනු ඇති අතර වෛද්‍යවරුන් සහතිකකරණය සහ/හෝ බලපත්‍ර නිකුත් කිරීම සඳහා වන අවසන් පූර්ව සූදානම් පියවර එය වේ.

වත්මන වනවිට පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ශාස්ත්‍රපති උපාධි සහ එම්.ඩී. වැඩසටහන් පැවැත්වීමෙහි ලා වගකීම දරන එකම ආයතනය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයයි. අපගේ විෂය මණ්ඩල සියළුම විශ්වවිද්‍යාලයන්හි වන විශේෂඥයින් කිහිපදෙනෙකුගෙන් සමන්විතය. අපගේ එම්.ඩී. වැඩසටහන, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, සිංගප්පූරුව හෝ ඉන්දියාව යන රටවල් අතුරින් එකක වන හඳුනාගත් මධ්‍යස්ථානයක පැවැත්වෙන අවම වශයෙන් වසරක් වත් වූ පුහුණු කාලයකින් සමන්විත වේ. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සියළුම ප්‍රධාන ක්ෂේත්‍රයන්ට සහ බොහොමයක් උපවිශේෂයන්ට අදළව විශේෂඥතාවන් පිරිනමයි. මෙම සියළුම විශේෂඥතාවන්ට අදළව පුරප්පාඩු සැපිරීම පිළිබඳව වගකීම සෞඛ්‍ය අමාත්‍යාංශය සතුවේ. බොහොමයක් ක්ෂේත්‍රයන්ට අදළව සිටින විශේෂඥ වෛද්‍ය වරුන් ගණන පවතින පුරප්පාඩු පිරවීම සඳහාවත් ප්‍රමාණවත් නොවේ. මෙම සියළුම පුරප්පාඩු පිරවීම සඳහා වෛද්‍යවරුන් සඳහා පාඨමාලාවන් පිරිනැමීම සහ එමගින් රට තුළ වන විශේෂඥ වෛද්‍යවරුන් ජනනය කිරීම වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ඉටුකරයි.
පහත ක්‍රමවේදයන් ඔස්සේ රටෙහි විශේෂඥ වෛද්‍යවරුන්ගේ අවශ්‍යතාව කවරාකාරද යන්න හඳුනාගැනීමට අවශ්‍ය දත්ත රැස් කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන තිබේ.

1. ග්‍රාමීය මෙන්ම නාගරික රෝහල් වල විශේෂඥ වෛද්‍යවරුන් ලෙස සේවය කරන වෛද්‍යවරුන් ගණන පිලිබඳව තොරතුරු ලබා ගැනීම.
2. සියළුම රාජ්‍ය විශ්ව විද්‍යාලයන්හි වෛදය විද්‍යා පීඨ වෙතින් තොරතුරු ලබා ගැනීම.
3. සාමාන්‍ය මහජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතා සහ ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ රෝගාබාධ ආදිය පිළිබඳව හඳුනාගැනීමට පියවර ගැනීම සහ ඒ අනුව විශේෂඥ වෛද්‍යවරුන් පුහුණු කිරීම. උදා:- නාරි හා ප්‍රසව වේදය, වයෝ වෛද්‍ය විද්‍යාව.
4. හමුදා රෝහල් සහ පොලිස් රෝහල් වෙතින් තොරතුරු ලබාගැනීම.
5. පෞද්ගලික රෝහල් ඔස්සේ තොරතුරු ලබාගැනීම.
6. සෞඛ්‍ය අමාත්‍යාංශය සහ රෝහල් අධ්‍යක්ෂකවරුන් වෙතින් තොරතුරු සපයා ගැනීම.

ඉහත දේ ලඟා කරගැනීම සඳහා ග්‍රාමීය රෝහල්ද ඇතුළුව සියළුම රෝහල්වල යටිතල පහසුකම් සමානව ඉහළ නැංවිය යුතු වේ, විශේෂඥ වෛද්‍යවරුන්ට මෙරට සියළු පුරවැසින්ට මනා සේවාවක් සැපයිය හැකි වනු ඇත්තේ එවිටය.

තවද මෙම ආයතනය තිරසර සංවර්ධනයේ ප්‍රධානතම අරමුණු වන සෞඛ්‍යය, යහපැවැත්ම සහ හරිත සංකල්පය යන අංශ යටතේ උපරිම සේවාවක් සලසමින් සිටියි. මීට අදාළව වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනික ප්‍රජාවෙහි සෞඛ්‍යය සහ යහපැවැත්ම

වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින්, සෞඛ්‍ය මධ්‍යස්ථානයක් සහ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ආරම්භ කරන ලදී. ආයතනයේ සෞඛ්‍ය මධ්‍යස්ථානය වෙතින් ආයතනික කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් හට ප්‍රතිකාර ලබාදීමේ සේවාවන් ඉටුකරයි. සේවකයන් හට නිසි නිවාරක උවටැන සහ වාර්ෂික පරීක්ෂාවන් සිදු නොකෙරෙන්නේ නම් දිඩි අසනීප තත්ත්වයනට ලක්වීම හේතුවෙන් දීර්ඝ කාලසීමාවන් තුල ඔවුනට සේවයට පැමිණීමට නොහැකි වනු ඇත. පහසුවෙන් ,නිරෝගීව, පහසුවෙන් මෙන්ම සතුටින් සිටීමට ලැබීම සේවකයන්ගේ කාර්යයන්හි ගුණාත්මකභාවයද ඉහළ නංවයි. පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය සියළුම දෙනා සඳහා ප්‍රමාණවත් සහ සාධාරණ ලෙස සනීපාරක්ෂක පහසුකම් සැලසීම සහ තම රජකාරි ජීවිතය සමබර කරගැනීමෙහි ලා අමතර සහායක් අවශ්‍ය වන කාන්තාවන් උදෙසා විශේෂ අවධානයක් යොමුකිරීමට අවශ්‍ය පියවර ගෙන තිබේ. වයස අවුරුදු 12 ට අඩු මට්ටමේ දරුවන් උදෙසා පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය තුළ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් අරඹන ලද අතර එමගින් රාජකාරියේ නිරත මවුවරුන් ආයනයෙන් පිටත දිවා සුරැකුම් මධ්‍යස්ථාන සෙවීමේ අසීරුතාවෙන් මුදවනු ලැබිණි. මෙම පහසුකම මගින් කාර්යාලය තුළ සේවයෙහි නිරත නිලධාරිනියන්ට තම දරුවන් නොමිලේ රැකබලා ගනු ලැබීමේ අවස්ථාව සැලසෙන අතර එමගින් කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව ඉහළ නංවනු ලැබේ.

ඊට අමතරව වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන ප්‍රජාව බලශක්තිය සුරැකීම, මයික්‍රොසොෆ්ට් ටීම්ස් වැනි නව තාක්ෂණික යෙදවුම්, පරිසර හිතකාමී චර්යාත්මක වෙනස්කම් සහ නිරෝගී ආහාර පුරුදු යන ක්ෂේත්‍රයන්හි ලා දැනුවත් කිරීම පිණිස දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

තවද, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් හරිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයක් බිහිකිරීමේ අරමුණින් හරිත මූලාරම්භයන් ගනු ලැබූ අතර, මෙම තිරසර හරිත මූලාරම්භයන් ජලසම්පත් සහ බලශක්තිය සුරැකීම මෙන්ම පිවිතුරු පරිසරයක් යන සංකල්ප ප්‍රවර්ධනය කරනු ඇත. ආයතනය තුළ හරිත සංකල්පය හඳුන්වාදීම 2020 වසරේදී සිදුවූයේ ලිබිතව පවා අදාළ සංකල්පය ස්ථාපනය කිරරී මගින් එය පූර්ණ තිරසර සංකල්පයක් කිරීමේ අරමුණෙනි. එම සැලැස්ම දියත් කිරීම සඳහා හරිත කමිටුවක් පවා පිහිටුවනු ලැබූ අතර පසුගිය වසරේ සිට එම කමිටුව විවිධ පාරිසරික ලක්ෂණයන් මත ක්‍රියාත්මක වේ. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, නිශ්චිත වන අරමුණකින්, දැක්මකින් සහ මෙහෙවරකින් මෙන්ම මූලධර්ම මාලාවකින් සමන්විත වේ. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් ප්‍රධාන විශ්ව විද්‍යාලයේ තිබි CFL බල්බ වෙනුවට LED බල්බ යෙදූ අතර ස්මාර්ට් ගොඩනැගිල්ලක් ලෙස සැලකිය හැකි රොඩ්නි වීදියේ ඉදිකළ අධ්‍යයන මධ්‍යස්ථානයේද LED බල්බ පමණක් සවිකරන ලදී. තවද වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් ඉන්වර්ටර් (අපවර්තක) වායු සමීකරණ යන්ත්‍ර, මාස්ටර් ස්විච සහ අඩු බලයක් මෙන්ම බලශක්තිය කාර්යක්ෂමව භාවිතා වන යෙදවුම් භාවිතය වෙත යොමුවන ලදී. එමෙන්ම, ඡායාපාටපත් යන්ත්‍ර සහ ස්කෑනර වැනි මෙවලම් හවුලේ භාවිතා කිරීමද දිරිමත් කරනු ලැබිණි. ආයතනය විසින් ගනු ලැබූ හරිත මූලාරම්භයන් අතර වඩාත්ම ප්‍රගතිශීලී පියවර වූයේ කඩදාසි භාවිතයෙන් තොර ආයතනයක් බවට පත්වීමයි. නිබන්ධන හැරුණු කොට අනෙකුත් සියළුම ලිපි ගනුදෙණු සහ භාරදීම් විද්‍යුත් තැපෑල ඔස්සේ සිදුකිරීම අනිවාර්ය වන අතර සියළුම අභ්‍යන්තර සබඳතාවන් මයික්‍රොසොෆ්ට් ටීම්ස් හරහා සිදුකිරීමත්, සියළුම කමිටු රැස්වීම් සහ දේශනයන් මාර්ගගතව පැවැත්වීමත් සිදුවිනි. මෙම ප්‍රවේශය මගින් කඩදාසි භාවිතය 65%-70% දක්වා අඩු කරන ලදී. ස්මාර්ට් ගොඩනැගිල්ලෙහි අත් වියළනයන් සවි කරනු ලැබූයේද, එකි වරක් පමණක් භාවිතා කොට ඉවත දමන

කඩදාසි අත්පිස්නා භාවිතය අවම කිරීම මගින් සිදුවන කඩදාසි අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කිරීම අරමුණු කරගනිමිනි. පිටුවක දෙපසම භාවිතා කරමින් මුද්‍රණය සිදුකිරීම දිරිමත් කරනු ලබන අතර වසර දෙකකට පමණ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනික ප්‍රජාව වීදුරු උපකරණ සහ ස්වාභාවිකව දිරාපත් වන කෝප්ප භාවිතය සිදුකරමින් සිටියි. පොලිතීන් ආහාර දවටන භෝජනාගාරය තුළ භාවිතය තහනම් වන අතර සෑම කෙනෙක්ම තම ආහාර භාජනයක දමා රැගෙන ආ යුතුය. කසළ වෙන් කිරීම CMC ප්‍රමිතිකරණය අනුව වෙන් වෙන් කසළ බඳුන් වෙත බැහැර කිරීම සිදු වේ.

ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස අප පසුගිය වසර තුළ සුවිශේෂී අභියෝග රැසකට මුහුණ දුන්නද ල මාර්ගගත ක්‍රියාකාරීත්වය සහිත කඩදාසි රහිත කාර්යාලයකට මාරු වී ඇති බැවින් ඇතැම් හරිත සංකල්ප අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අපට හැකි විය. ඒ අනුව හරිත සංකල්ප ක්‍රියාවට නංවමින් ඵලදායී ලෙස ක්‍රියාත්මක වීමට වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට හැකි විය.

2022 වසර තුළදී අපගේ හරිත මූලාරම්භයන් තවදුරටත් පුළුල් කරන ලද අතර 2022 වසර තුළදී ඉහත හරිත ප්‍රවේශයන්හි ක්‍රියාවෙහි යෙදවීම වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් දැඩි අධීක්ෂණයට ලක්කරන ලදී. විදුලි භාවිතය අඩුකිරීමේ අරමුණින් ශාඛාවක සේවක සංඛ්‍යාව අඩු වූ විට වායුසමීකරණ යන්ත්‍ර භාවිතා කිරීම වෙනුවට විදුලි පංකා භාවිතය දිරිගැන්වීමේ අරමුණින් කාර්ය මණ්ඩලයට පදික පංකා බෙදා හැර ඇත. තවද UI Green Metric සම්මානය ලබා ගැනීම ඉලක්ක කරගනිමින් කාබන් පියසටහන් භාවිතය : (එනම් සමස්ත හරිතාගාර වායු විමෝචනය) පිළිබඳ සංඛ්‍යාලේඛන කොළඹ විශ්ව විද්‍යාලයට ලබා දී ඇත.

.

16. 2022 වසර තුළ සිදුවූ විශේෂ සිදුවීම්

2022 වසර සඳහා නව වසර සැමරීම





2022 වසරට අදාළ ප්‍රථම කළමණාකරණ මණ්ඩල රැස්වීම






PGIM කාර්ය මණ්ඩලය සඳහා පැවැත්වූ 5S පිළිබඳ වැඩමුළුව





17. විගණන වාර්තාව හා පිළිතුරු



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එවවිඩ/බ/පිපීඅයිඑම/2022/එස්ඒ/02 | ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2023 ජූනි 23 දින

30 JUN 2023 Accounts Branch

JUN 2023 Director's Office

DB

අධ්‍යක්ෂ,

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

සහතික කරන ලද ගිණුම් සහ යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.පොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :-

1. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය,
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.
3. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.
4. උපකුලපති - කොළඹ විශ්වවිද්‍යාලය.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/B/PGIM/2022/FA/02

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 ජූනි 23 දින

අධ්‍යක්ෂ,

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, නිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය හා 18 වන වගන්තිය යටතේ පවරා ඇති 1980 අංක 01 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 20 වන වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු

කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. අනෙකුත් කරුණු

(අ) වර්ෂ 1 ත් වර්ෂ 7 ත් දක්වා වූ කාලයක සිට පවතින එකතුව රු.14,988,019 ක් වූ විවිධ ණයහිමියන්, වර්ෂයකට වඩා පැරණි එකතුව රු.741,703 ක් වූ ගෙවිය යුතු තැන්පතු හා එකතුව රු.1,131,929 ක් වූ උපචිත වියදම් සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල් කර නොතිබුණි.

(ආ) 2015, 2016 හා 2017 වර්ෂයන්ට අදාලව සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.2,597,375 ක් සමාලෝචිත වර්ෂය තුලදී ද අය කර ගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න,
විගණකාධිපති.

Postgraduate Institute of Medicine
University of Colombo, Sri Lanka

Professor Senaka Rajapakse
MD, FRCP(Lon), FRCP(Edin), FCCP, FACP, FNAS(SL)
Director

ඒබී/ඕ/පිජීඅයිඑම

2023 ජූලි 24

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

<u>කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ **2022** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **12** වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් අප වෙත යොමු කර ඇති එච්ඊඩී/බී/පිජීඅයිඑම/ 2022/ එෆ්ඒ / 02 අංකය දරන 2023 ජූනි 30 වැනි දින අප වෙත ලැබුණු විගණන වාර්තාව හා බැඳේ.

ඒ අනුව අදාල පිළිතුරු මේ සමඟ එවා ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

<u>3.</u> <u>අනෙකුත් කරුණු</u>

(අ) මේ වන විටත් විවිධ ණයහිමි ශේෂයන්ට අදාළ තොරතුරු විශ්ලේෂණය කරමින් සිටින අතර 2023 වර්ෂය තුලදී ඉදිරිපත් නොවූ ශේෂ ආදායමට ගැනීම සඳහා ආයතනයේ මූල්‍ය කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි. තවද ගෙවිය යුතු තැන්පතු හා උපචිත වියදම්ද මෙම වර්ෂය තුලදී නිරවුල්කර ගැනීමට කටයුතු කරමි.

(ආ) මෙම මුදල් කඩිතමින් ප්‍රතිපූර්ණය කරන ලෙසට නැවතත් සිහි කැඳවමින් 2023 ජූලි 19 වන දින සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලිපියක් ඉදිරිපත් කරන ලදි. (ඇමුණුම 01)

මහාචාර්ය සේනක රාජපක්ෂ
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

Professor Senaka Rajapakse
MBBS, MD, FRCP, FRCPE, FCCP, FACP, FNAS(SL)
Director
Postgraduate Institute of Medicine
University of Colombo

General Office: 160, Prof. Nandadasa Kodagoda Mawatha, Colombo 07, Sri Lanka. Tel: +94 11 2697758/2696261/2681052 Web: www.pgim.cmb.ac.lk

Director	Academic Branch	Examinations. Branch	Library	Medical Education Resource Centre
Tel:+94 11 2688649	Tel: +94 11 2687511	Tel: +94 11 2683467/2696258	Tel: +94 11 2697760/61	Tel: +94 11 3612906
Fax :+94 11 2697757	Fax: +94 11 2687806	Fax: +94 11 2687803	Fax: +94 11 2687050	merc@pgim.cmb.ac.lk
Email:director@pgim.cmb.ac.lk	academic@pgim.cmb.ac.lk	exam@pgim.cmb.ac.lk pgimint@pgim.cmb.ac.lk	library@pgim.cmb.ac.lk	

Postgraduate Institute of Medicine
University of Colombo, Sri Lanka

Professor Senaka Rajapakse
MD, FRCP(Lon), FRCP(Edin), FCCP, FACP, FNAS(SL)
Director

සිවුවන සිනිකැඳවීම

My No: PGIM/AB/K

2023 ජූලි මස 19

අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත ගෙවීම් කිරීමට ඇති පාඨමාලා ගාස්තු සහ පුස්තකාල පරිශ්‍රය සඳහා කුලිය ගෙවීම.

උක්ත කරුණ සම්බන්ධයෙන් 2020.11.12 දින නිකුත් කරන ලද අභ්‍යන්තර සටහන සම්බන්ධවයි.

ඔබ ආයතනය විසින් ගෙවීම් කිරීමට ඇති පහත සඳහන් හිඟ මුදල් සම්බන්ධයෙන් අප විසින් මීට පෙර් අවස්ථා කිහිපයකදි සිහිකැඳවීම් සිදුකර ඇති අතර මෙතෙක් ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන නොමැත. අදාල හිඟ මුදල වූ රු.2,597,375.00 සම්බන්ධයෙන් 2022 වර්ෂයේ විගණන වාර්තාවෙහිද සඳහන් කර ඇති බැවින් අදාල මුදල් හැකි ඉක්මනින් අප වෙත ප්‍රතිපූරණය කිරීමට කටයුතු සම්පාදනය කරනු ඇතැයි කාරුණිකව අපේක්ෂා කරමි.

මේ සම්බන්ධව සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශය විසින් ගෙවීමට අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට නිකුත් කරන ලද ලිපිවල ජායාපිටපත් මේ සමඟ අමුණා එවමි.

විස්තරය	වසර	හිඟ මුදල (රු.)
පුස්තකාල පරිශ්‍රය සඳහා කුලිය	2015	981,625.00
	2017	700,000.00
පාඨමාලා ගාස්තු	2016	915,750.00
මුළු මුදල		**2,597,375.00**

මහාචාර්ය සේනක රාජපක්ෂ
අධ්‍යක්ෂ
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

General Office: 160, Prof. Nandadasa Kodagoda Mawatha, Colombo 07, Sri Lanka. Tel: +94 11 2697758/2696261/2681052 Web: www.pgim.cmb.ac.lk

Director Tel:+94 11 2688649 Fax: +94 11 2697757
Academic Branch Tel: +94 11 2687511 Fax: +94 11 2687806
Examinations. Branch Tel: +94 11 2683467/2696258 Fax: +94 11 2687803
Library Tel: +94 11 2697760/61 Fax: +94 11 2687050
Medical Education Resource Centre Tel: +94 11 3612906 merc@pgim.cmb.ac.lk

අභ්‍යන්තර සටහන

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

වෙත	:	අධ්‍යක්ෂ (ගොඩනැගිලි)
වෙතින්	:	ගණකාධිකාරී (මුදල්) වැය 11
පිටපත්	✓	අධ්‍යක්ෂ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
විෂයය	:	වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත පුස්තකාල පරිශ්‍රය සඳහා කුලිය ගෙවීම.
යොමු අංකය	:	FXM
දිනය	:	2020.11.17

ඉහත කරුණ සම්බන්ධයෙන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2020 ජූලි මස 28 දිනැති ලිපිය හා සබැඳේ.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත පුස්තකාල පරිශ්‍රය සඳහා කුලිය ලෙස 2015 හා 2017වෙනුවෙන් රු. 1,681,625.00ක් ගෙවීමට ඇති බව දන්වා එවා ඇත. එයට අදාල වවුචර් පත් එවීමට කටයුතු කරන මෙන් කරුණාවෙන් දන්වා සිටිමි.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් එවා ඇති ලිපියේ පිටපතක් ඉමයට අමුණා එවමි.

අභ්‍යන්තර සටහන

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

වෙත : අධ්‍යක්ෂ (තෘතීයික සත්කාර සේවා)

වෙතින් : ගණකාධිකාරි (මූදල්) වැය 11

පිටපත් : අධ්‍යක්ෂ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

විෂයය : වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත පාඨමාලා ගාස්තු ගෙවීම.

යොමු අංකය : FX/W\

දිනය : 2020.11.12

ඉහත කරුණු සම්බන්ධයෙන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2020 ජූලි මස 28 දිනැති ලිපිය හා සබැඳේ.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත පාඨමාලා ගාස්තු වශයෙන් 2016 වසර වෙනුවෙන් රු. 915,750.00ක් ගෙවීමට ඇති බව දන්වා එවා ඇත. එයට අදාල වවුවර් පත් එවීමට කටයුතු කරන මෙන් කරුණාවෙන් දන්වා සිටිමි.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් එවා ඇති ලිපියේ පිටපතක් මෙයට අමුණා එවමි.